*2017 පෙබරවාරි මස 07 අඟහරුවාදා දින*
*2017 பெப்ரவரி மாதம் 07 ஆம் திகதி செவ்வாய்க்கிழமை*
***Tuesday 07th February 2017***

ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමාගේ මූලාසනාරූඪත්වයෙන් පෙ.ව.10.00 ට සභාව රැස්විය.

கௌரவ தவிசாளர் - கஞ்சன ஜயரத்ன அவர்களின் தலைமை வகித்தார்கள் மு.ப. 10.00 மணிக்கு சபைக் கூடியது.

The Council met at 10.00 a.m Hon.Chairman Kanchana Jayarathna preside the Chair

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-------------------------------------------------------------

සියළුදෙනාටම සුභ උදෑසනක් වේවා ! ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ඒ වගේම ගරු අමාත්‍යතුමන්ලා, විපක්ෂනායකතුමා ප්‍රමුඛ සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි. අද දිනට න්‍යාය පත්‍රානුකූලව මෙම ගරු සභාවේ වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා

**අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා හෝ දිවුරුම්දීම : නැත**

**ආණ්ඩුකාරතුමාගෙන් ලැබෙන සංදේශ : නැත**

**ගරු සභාපතිතුමාගේ නිවේදන : නැත**

**නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා :**

ගරු අමාත්‍ය භාණු මුණිප්‍රිය මැතිතුමා.
ගරු මන්ත්‍රී පී.අබේනායක මැතිතුමා.
ගරු මන්ත්‍රී ලක්ෂ්මන් කොඩිකාර මැතිතුමා.
ගරු මන්ත්‍රී උපුල් ශ්‍යාමල් බණ්ඩාර මැතිතුමා.

ඉහත නම් සඳහන් ගරු මැති ඇමතිතුමන්ලා හට සභාවේ නිවාඩු අනුමත විය.

**ලිපි ලේඛණ පිළිගැන්වීම :**

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමා විසින් සභාගත කරන ලද ලිපියක් සම්බන්ධයෙන් පිළිතුරු ලැබී තිබෙනවා. එය එතුමාට ලැබෙන්න සළස්වනවා.

*ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය*
*கௌரவ நமிந்த அனுரபிரிய* *Hon.Member*
*Naminda Anurapriya* -----------
--------------------------------------------------

ගරු සභාපතිතුමනි, පොඩි අවස්ථාවක් ලබාදෙන්න. ලිපි පිළිගැන්වීම පිළිබඳව. පසුගිය සභාවේ දී මම ලිපියක් සභාගත කළා ගරු සභාපතිතුමනි, පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් කරන්න.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
--------------------------------------------------------------

ඒක ඔබතුමා පෙත්සම්වලට අදාළව කථා කරන්න. මේ ලිපි ලේඛණ පිළිගැන්වීම.

**කාරක සභා වාර්තා පිළිගැන්වීම : නැත**

**පෙත්සම් :**

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
--------------------------------------------------------------

මේ යටතේ පෙත්සම් ඉදිරිපත් වී නැහැ. මොකක්ද ඔබතුමාට ඉදිරිපත් කරන්න තියනවා කිව්වේ.

*ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය*
*கௌரவ நமிந்த அனுரபிரிய* *Hon.Member*
*Naminda Anurapriya* -----------
--------------------------------------------------

ගරු සභාපතිතුමනි, මම පසුගිය සභා වාරයේ දී පෙත්සමක් ඉදිරිපත් කළා. ඒ පෙත්සම්කරුට ගරු සභාපතිතුමනි, ලිපියක් යවා තිබෙනවා. මා අතින් පොඩි අඩු පාඩුවක් සිදුවුනා ගරු සභාපතිතුමනි, මම පෙත්සමක් ඉදිරිපත් කරන අවස්ථාවේ දී පුරවන ආකෘති පත්‍රය පුරවන්නේ නැතුව තමයි මම පෙත්සම ඉදිරිපත් කළේ. නමුත් පෙත්සම සභාගත වුනා. ඒ අවස්ථාවේ දී මා අතින් ඒ වැරුද්ද වුනා. නමුත් පෙත්සම්කරුට ලිපියක් ගිහිල්ලා තියනවා ගරු සභාපතිතුමනි, ප්‍රදේශයේ ඉන්න වෙනත් මන්ත්‍රීවරයෙකුගේ මාර්ගයෙන් මේක එවන්න කියලා. ඒ අනුව මෙම පෙත්සම ඔබ ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු මාර්ගයෙන් නැවත සබරගමුව පළාත් සභාවේ පෙත්සම් කාරක සභාවට යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා කියලා. නමුත් මමත් මන්ත්‍රීවරයෙක් හැටියට තමයි ඉදිරිපත් කළේ. අර ආකෘති පත්‍රය පුරවන්න ඕන නම් මම නැවත පුරවලා දෙන්නම්. නමුත් මේකේ පිටපතක් මට එවලත් නෑ ගරු සභාපතිතුමනි. මමත් මන්ත්‍රීවරයෙක්. ඒ නිසා මේක නැවත විමර්ශණය කරලා, නැවත ඒ පෙත්සම භාරගන්න හැටියට මම ඉල්ලා සිටිනවා. මේ ලිපිය, ඒ පෙත්සම්කරුට යවපු ලිපිය සභාගත කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
--------------------------------------------------------------

ඔබතුමාට යම්කිසි අපහසුතාවයකට පත් වුනා නම් අපි ඒ පිළිබඳව කණගාටුවට

පත් වෙනවා. මම ඒ පිළිබඳව සොයා බලා ඔබතුමාට එවපු ලිපියත්, එහි පිටපතක් නොලැබීම පිළිබඳවත් සොයා බලා ඊට අවශ්‍ය කටයුතු කිරීමටත්, ඉදිරි කටයුතු කොයි ආකාරයෙන් ද කරන්නේ කියන එක පිළිබඳව ඔබතුමා දැනුවත් කිරීමටත් අපි කටයුතු කරනවා.

**ප්‍රශ්න : නැත**

**අමාත්‍යාංශ නිවේදන හෝ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ :**

*ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.*
*கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார*
*Hon. Minister Ranjith Bandara*
-------------------------------------------------------

ගරු සභාපතිතුමනි, අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ යටතේ එක් ශිෂ්‍යාවක් ගැන කියන්න ඔබතුමාගෙන් අවසර ඉල්ලනවා. ඩබ්.එම්.ජීවනී ප්‍රියන්තිකා කියන දෘෂ්‍යාබාධිත ශිෂ්‍යාව වසර 6 ක කාලයක ඉඳලා අපේ පරිවාස දෙපාර්තමේන්තුවේ ළමා නිවාසවල, ඒ වගේම යශෝධරා බිහිරි විද්‍යාලයේ බලන්ගොඩ, ඒ වගේම කුලරත්න ළමා නිවාසයේ නේවාසිකව ඉඳලා අද මේ වෙනකොට විශ්ව විද්‍යාලය සඳහා තේරී පත්වෙලා තිබෙනවා. ඒ නිසා මම මේ ගරු සභාවට දෘෂ්‍යාබාධිත දරුවෙක් සම්බන්ධව පළාත් සභාවේ සුභ පැතුම් ඇයට එක් කරන්නට ඔබතුමාගෙන් අවසරය ඉල්ලනවා. බොහොම ස්තුතියි !

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තුතියි ! ගරු අමාත්‍යතුමනි. ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද ඒ කාරණාව පිළිබඳව, ඒ සුභ පැතුම පිළිබඳව පෞද්ගලිකව එතුමිය වෙත දන්වා යැවීමට කටයුතු කරනවා.

**පෞද්ගලික ප්‍රකාශ කිරීම් :**

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

සලිත කරුණාරත්න මන්ත්‍රීතුමාට අවස්ථාව.

*ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න*
*கௌரவ உறுப்பினர் சலித கருணாரத்ன*
*Hon.Member Salitha Karunaratne*
**--------------------------------------------------**

ගරු සභාපතිතුමනි, පහුගිය ජනවාරි 02 වෙනිදා මම රාජකාරි කාර්යයක් සඳහා කොළඹ ගියා අමාත්‍යාංශයකට යන්න. ගරු සභාපතිතුමනි, එදා බරපතල විදිහට මම පැය තුනක් කොළඹ නගරයේ රස්තියාදු වුනා. හේතුව දැවැන්ත විරෝධතාවයක් නිසාවෙන්. ගරු සභාපතිතුමනි, බලාගෙන ගිහාම සවුත් ඒෂියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින් කියන ආයතනයට

විරුද්ධව දැවැන්ත උද්ඝෝෂණයක්. මම බැලුවා මේ මොකක්ද දැවැන්ත විරෝධතාවය කියලා. බලාගෙන ගිහාම ගරු සභාපතිතුමනි, 2008 පිහිටුවලා තියන දකුණු ආසියානු තොරතුරු හා තාක්ෂණ වෛද්‍ය විද්‍යාලය කියන ආයතනයට විරුද්ධව තමයි මේ මහා දැවැන්ත උද්ඝෝෂණය. ගරු සභාපතිතුමනි, බලාගෙන ගිහාම සිය දහස් ගණනක් තරුණ තරුණියන්ට කඳුළු ගෑස් ගහනවා, වෙඩි තියනවා මහා කළබැගෑනියක්. ගරු සභාපතිතුමනි, මේක සම්බන්ධයෙන් හොයලා බැලුවාම ඊට පස්සේ දැනුනා රටේ ලොකු දැවැන්ත තරුණ නැගිටීමකට මග පාදන තත්ත්වයක් තමයි උදාවෙලා තියෙන්නේ. ඊට පස්සේ ගරු සභාපතිතුමනි, මම පහුවදා කොළඹ ගියා ජාතික රෝහලට බෙහෙත් ගන්න. එදා වෛද්‍ය වර්ජනයක්. ගරු සභාපතිතුමනි, බරපතල කාරණයක්. ඊට පස්සේ හොයලා බැලුවාම ගරු සභාපතිතුමනි, ආරංචියි දැවැන්ත රටේ වර්ජනයකට මගපාදන සිද්ධියක් වෙලා තියනවා. ගරු සභාපතිතුමනි, මම අර කියපු දකුණු ආසියානු තොරතුරු සහ වෛද්‍ය විද්‍යාලය කියන සයිටම් ආයතනය, ගරු සභාපතිතුමනි, මේ සයිටම් ආයතනය සම්බන්ධයෙන් අධිකරණ තීන්දුවක් දීලා තියනවා. ඒක හරි. හැබැයි ගරු සභාපතිතුමනි, අධිකරණ තීන්දුව මොනවා වුනත් රටේ පවතින සාමාජීය, දේශපාලන කාරණාවලට පිටුපාලා වැඩ කටයුතු කළොත් රට අරාජික වෙයි, මහා විනාශයක් සිද්ධ වෙයි. මුදලට වෛද්‍ය උපාධිය දෙන කාරණාවක් සිද්ධ වෙයි. ගරු සභාපතිතුමනි, ඒ හින්දා 1981 උතුරු කොළඹ රාගම වෛද්‍ය විද්‍යාලය සම්බන්ධවත් මේ වගේ අධිකරණ තීන්දුවක් ආවා. ගරු සභාපතිතුමනි, ඒ හින්දා මම මේ කියන්නේ උතුරු කොළඹ වෛද්‍ය විද්‍යාලය සම්බන්ධයෙන්

**(සභාවෙන් ඝෝෂා)**

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

නිශ්ශබ්ද වෙන්න.

*ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න*
*கௌரவ உறுப்பினர் சலித கருணாரத்ன*
*Hon.Member Salitha Karunaratne*
---------------------------------------------------

ගරු සභාපතිතුමනි, මම මුහුණ දීපු සිද්ධිය මේ.

*ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය*
*கௌரவ நமிந்த அனுரபிரிய* *Hon.Member Naminda Anurapriya*
-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් තියනවා. ගරු සභාපතිතුමනි, පෞද්ගලික දෙයක් තියනවා නම් පෞද්ගලික හේතු යටතේ ඒක ප්‍රකාශ කරන්න දෙන්න ඕන. ඒකට විරුද්ධ වෙන්න බෑ.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
--------------------------------------------------------------

සියළුදෙනාම වාඩි වෙන්න දැන්. සලිත මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

*ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න*
*கௌரவ உறுப்பினர் சலித கருணாரத்ன*
*Hon.Member Salitha Karunaratne*
-----------------------------------------------------

ඒ හින්දා ගරු සභාපතිතුමනි, මේ රටේ දැවැන්ත වැඩ වර්ජනයකට ගිහිල්ලා වෛද්‍යවරු වර්ජනය කරලා රට බරපතල කාරණයකට යන්න හදන්නේ. ඒ හින්දා මේ වැඩේ නතර වෙන්න ඕන. මේ වැඩේ නතර වෙන්න තියන විදිහ තමයි ඔබතුමන්ලාගේ නායකයා වෙච්ච ජේ.ආර්.ජයවර්ධන මහත්මයා තීන්දුවක් ගත්තා. එතුමා වැරදි විදිහට පෞද්ගලික ඒවා හැදුවා. හැබැයි එතුමා දේශපාලන අරගල හින්දා රාගම වෛද්‍ය විද්‍යාලය රජයට පවරා ගත්තා. ඒ නිසා ඒ විදිහට මාලඹේ සයිටම් වෛද්‍ය විද්‍යාලයත් රජයට පවරා ගන්න කියලා ප්‍රකාශ කරනවා.

**(සභාවෙන් සෝෂා)**

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
--------------------------------------------------------------

සලිත මන්ත්‍රීතුමා දැන් ඕක අවසාන කරන්න. ගරු මන්ත්‍රීතුමන්ලා සියළුදෙනාම දැනුවත් කරන්නේ කරුණාකරලා තමුන්නාන්සේලාට පෞද්ගලිකව ප්‍රකාශ කරන්න තියන කාරණා පෞද්ගලික ප්‍රකාශ කිරීම් යටතේ කථා කරන්න. ඒකට ගැටළුවක් නෑ. ඔබතුමා පෞද්ගලික ප්‍රකාශ කිරීම් යටතේ ගත්තු බවත් හරි. ඔබතුමාට වෙච්ච මාර්ග තදබදය හින්දානේ ඔබතුමා කථා කළේ. දැන් මෙතුමන්ලාගේ විරෝධය තියෙන්නේ මාර්ග තදබදය යටතේ නෙමෙයිනේ ඔබතුමා කථා කළේ. මාර්ග තදබදයෙන් පටන් අරගෙන වෙන එකක් කථා කළා කියන එක. ඒ නිසා මම මීට ඉහතදීත් අවස්ථාවක ඔබතුමන්ලා ඒ පිළිබඳව දැනුවත් කළා. දැන් දෙවෙනි අවස්ථාව. තුන්වෙනි අවස්ථාවකට ඉඩ තියන්න එපා කියලා තමුන්නාන්සේලා සියළුදෙනාගෙන්ම ඉල්ලා සිටිනවා.

මීළඟට ගරු අකිල සාලිය එල්ලාවල ගරු මන්ත්‍රීතුමා. ඒකත් ඒ ජාතියෙ එකක්ද ?

*ගරු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා.*
*கௌரவ உறுப்பினர் அகில எல்லாவல*
*Hon. Member Akila Ellawala*
-------------------------------------------------------------

ඒ වගේ පොඩ්ඩක්. ඒක මේ දැන් ආරංචි වුන කාරණාවක්. ඒක නිසා මේක වැදගත්. මගේ ආසනයට අල්ලපු ආසනයේ. අතුල රාහුබද්ධ ඇමතිතුමාගේ ආසනයේ. එතුමාත් එක්කත් මම සාකච්ඡා කළා මේ පිළිබඳව. වේවැල්වත්ත ප්‍රාථමික විද්‍යාලයේ ගුරුවරු අට දෙනයි ඉන්නේ. ඉතින් පහළොවක් ඕන කියලා මේ වෙලාවේ දී වේවැල්වත්ත, රත්නපුර මාර්ගය වසාගෙන දෙමව්පියන් සහ දරුවන් සියළුදෙනාම පාර බ්ලොක් කරගෙන උද්ඝෝෂණයක් කරමින් පවතිනවා. මේ පිළිබඳව ගරු අධ්‍යාපන ඇමතිතුමා නම් නෑ අද. නමුත් ලේකම්තුමාගේ හරි අවධානය

යොමු කරලා මෙය විසඳීමට අවශ්‍ය කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! ගරු අකිල එල්ලාවල මැතිතුමා විසින් ඉදිරිපත් කරපු යෝජනාව අපි ඉදිරි කටයුතු සඳහා ඉදිරිපත් කරනවා.

**ශෝක ප්‍රකාශ යෝජනා : නැත.**

**පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය නොවන යෝජනා : නැත**

**පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය යෝජනා : නැත**

**පළාත් සභාවේ පොදු කටයුතු :**

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

මේ යටතේ ශ්‍රී ලංකා තිරසාර සංවර්ධනය පිළිබඳ පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා අවසානවරට පැවතිච්ච ගරු සභාවේ දී මේ පිළිබඳව සභාගත කිරීමෙන් අනතුරුව අද දවසේ දී ඒ සඳහා සාකච්ඡා කිරීමට යෝජනා කරගෙන තිබුණා. ඒ අනුව මේ පිළිබඳව ඉදිරිපත් කිරීම සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යෝජනා කරනවා.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர்***
*Hon.Chief Minister Mahipala Herath*

---

ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන වැඩ සටහන පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා පනතක් අනුමත කිරීමට පෙර පළාත් සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන මේ අවස්ථාවේ දී විශේෂයෙන්ම මෙම පනත සම්බන්ධයෙන් අපේ ගරු ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස අනුව ගරු සභාපතිතුමනි, සංශෝධන දෙකකට යටත්ව අපි මෙම පනත අනුමත කිරීමට අපේ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා එකඟතාවය පළ කරලා තියනවා. ඒ සංශෝධන දෙක වන්නේ, එකක් විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන තිරසාර සංවර්ධන පනත් කෙටුම්පතට අනුකූල නොවන යම් වගන්තියක් මෙම ගැසට් පත්‍රයේ වේ නම් එයට අපේ එකඟතාවයක් නොමැති බවත්, ඊළඟ කාරණාව පළාත් සභාවක් ලෙස නිරන්තරයෙන්ම මෙම තිරසාර සංවර්ධනයේ සියළුම කොමිටි අවස්ථාවල දී පළාත් සභාවේ නියෝජනය අඛණ්ඩව සෑම කොමිටියකම සහභාගීත්වය සඳහා නම් කළයුතු ලෙස සංශෝධනය වියයුතුයි කියන අදහස් දෙකට ගරු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් එකඟතාවයකට පත්වෙලා තිබෙනවා. ඒ නිසා එසේ විරුද්ධ පක්ෂයත් එකඟ නම් අපි ඒ පනත මේ සංශෝධන දෙකට යටත්ව ආණ්ඩු පක්ෂයේ

එකඟතාවය පනත වෙනුවෙන් අනුමත කරන්නට අපි එකඟයි.

ඒක තමයි අපි සාකච්ඡා කළා මෙතෙක් වෙලා. අපි මේ පනතේ මේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේ දී රටේ සංවර්ධනය සඳහා ගන්නා වූ තීන්දු සඳහා අපේ එකඟතාවයට කිසිම තැනක, මේක කරුණාකරලා අපේ අදහස් ටික අහගන්න. අහගෙන තමුන්නාන්සේලා තීන්දුවක් ගන්න. මොකද මේකට අපි විරුද්ධ නෑ. නමුත් අපේ අයිතිය පළාත් සභාව ලෙස තිබිය යුතුයි.

ඊළඟ කාරණාව මේ පනත පළමුවෙන්ම ගෙනාවේ අතිගරු ජනාධිපතිතුමා. එතුමාගේ ඒ කරන ලද ගැසට් පත්‍රයේ නිවේදනය පරිදි එයට අනුකූල නොවන යම්කිසි දෙයක් පනතේ වෙන්නේ නම් අපේ පළාත් සභාව ලෙස අපේ ආණ්ඩු පක්ෂය ඒක අනුමත කරන්නේ නෑ. ඒ නිසා අන්න ඒ කරුණු දෙක අපි ඉදිරිපත් කරලා, ඒ දෙකට අනුකූලව අපි මේක අනුමත කරන්න අපේ එකඟතාවය තියනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තූතියි ! ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. ගරු විපක්ෂනායකතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ආණ්ඩු පක්ෂයේ ස්ථාවරය සහ මේ පනත පිළිබඳව එතුමන්ලා විසින් දරණ මතය සංශෝධන දෙකක් සහිතව එතුමා විසින් ප්‍රකාශ කරන්න යෙදුනා. ඒ පිළිබඳව විපක්ෂය හැටියට ඔබතුමන්ලා හත් දෙනෙකුගේ කථික ලැයිස්තුවක් භාරදීලා තියනවා මේ පිළිබඳව විවාදයට ගතයුතුයි කියලා. විවාදයට යායුතුයිද? එහෙම නැත්නම් සංශෝධන සහිතව මෙය සභා සම්මත කිරීමට එකඟයිද ? කියන එක පිළිබඳව ඔබතුමන්ලාගේ ස්ථාවරය ප්‍රකාශ කරන්න.

*ගරු මන්ත්‍රී අජිත් කුමාර*
*கௌரவ உறுப்பினர் அஜித் குமார*
*Hon.Member Ajith Kumara*

---

ඒ සංශෝධන දෙක සම්බන්ධයෙන් අපේ විරුද්ධත්වයක් නෑ. ඒක එසේ වියයුතුයි කියන එක තමයි අපේ මතය. විවාදයකට යනවා නම් අපි සූදානමින් ඉන්නවා ඒක කථා කරන්න.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

ඒක ඔබතුමන්ලා තීන්දු කරන්න. එතුමන්ලාගේ යෝජනා දෙක, සංශෝධන දෙක එතුමන්ලා ඉදිරිපත් කරලා තියනවා. ඒ දෙකට යටත්ව එතුමන්ලා එකඟයි. ඊට අමතරව තියෙනවා නම් අපට ඡන්දයකට යන්න වෙනවා. එතකොට ඔබතුමන්ලාගේ ස්ථාවරය, ඔබතුමන්ලත් ඒ දෙකට එකඟයි නම් දිගට තවදුරටත් මේක සාකච්ඡා කරන්නේ නැතුව මේක ඒ දෙකට යටත්ව සම්මත කිරීමට එකඟයි නම් අපට මේක මෙතනින් අවසන් කරන්න පුළුවන්. එහෙම නැත්නම් ඔබතුමන්ලා තවදුරටත් සාකච්ඡා කළයුතුයි කියලා කියනවා නම්

කියන්න. එතකොට අපට ඡන්දයකට ගිහිල්ලා අවසන් කරන්න පුළුවන්.

*ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්*
*கௌரவ பிரதான அமைச்சர்*
*Hon.Chief Minister Mahipala Herath*

---

ගරු සභාපතිතුමනි, ඇත්තටම ගරු සභාව මේක පක්ෂද ? විපක්ෂද ? කියන මතය නෙමෙයි සභාවේ අයිතිය තමයි ගරු ආණ්ඩු පක්ෂය ඉදිරිපත් කරලා තියෙන්නේ. සභාවක අයිතිය. අපට මේ පළාතේ යම් සංවර්ධනයක් වෙන්නේ නම් මේ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් අපි ඒක දැනුවත් වියයුතුයි. ඒ දැනුවත් වීම සඳහා අපට අවස්ථාවක් නැත්නම් අපි ඒකට එකඟ වෙන එකේ, මම හිතන්නේ ඔබතුමන්ලා හිටියත්, අපි හිටියත් කාටත් එතන අසාධාරණයක් සිද්ධ වෙනවා. ඒ කරුණු අපේ ගරු මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කරලා තියනවා. අනෙක් එක තමයි අතිගරු ජනාධිපතිතුමා විසින් ගෙන එන ලද එම ගැසට් පත්‍රයේ සඳහන් පරිදි නොවෙන දෙයක් තිබේ නම් අපි එයට විරුද්ධයි. ඒ හැර වෙනත් අපේ කිසි ප්‍රශ්නයක් නෑ. මේ පනත අනුමත කිරීම සම්බන්ධයෙන් අපේ එකඟතාවය තියනවා.

*ගරු මන්ත්‍රී අජිත් කුමාර*
*கௌரவ உறுப்பினர் அஜித் குமார*
*Hon.Member Ajith Kumara*

---

ගරු සභාපතිතුමනි, මේ සංශෝධනයට කිසිම අපේ විරුද්ධත්වයක් නෑ. නමුත් අපේ මන්ත්‍රීවරුන්ට අවස්ථාවක් දෙනවා නම් සාකච්ඡා කරන්න....

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

ආණ්ඩු පක්ෂය කියන්නේ නෑ ඔබතුමන්ලාට අවස්ථාව දෙන්න බෑ කියලා. ඔබතුමන්ලාගේ කථික ලැයිස්තුවේ හත් දෙනෙකුගේ නම් දීලා තියනවා. ඔබතුමන්ලා මේක සාකච්ඡා කළයුතුයි කියලා කියනවා නම් ඉඩකඩ දීමේ බාධාවක් නෑ. අවසානයේ දී ඡන්දයකට අපට යන්න වෙනවා. නැත්නම් මට ඊට පස්සේ වෙනස් කරන්න බෑ.

*ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස*
*கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச*
*Hon.Opposition Leader W.Somadasa*

---

ගරු සභාපතිතුමනි, තිරසාර සංවර්ධන යෝජනාවට අපේ පළාත් සභාවේ ප්‍රධාන ඇමතිතුමා සංශෝධන දෙකක් ඉදිරිපත් කළා. ඒ දෙකට අපි එකඟ වෙනවා. ඒක නිසා අපට සාකච්ඡාවක අවශ්‍යතාවයක් නෑ. අපි ඒක සම්මත කරගන්න එකඟයි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! ගරු විපක්ෂනායකතුමනි. ඒ අනුව ශ්‍රී ලංකා තිරසාර සංවර්ධනය පිළිබඳ පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කිරීමේ අවස්ථාවේ දී මීළඟට තිබෙන්නේ

මේ කාරණාව පිළිබඳව ගරු ප්‍රධාන අමාත්‍යතුමා ආණ්ඩු පක්ෂයේ ස්ථාවරය සංශෝධන දෙකක් සහිතව ඉදිරිපත් කළා. එතුමන්ලා ඒ සංශෝධන දෙකට එකඟව මේක සම්මත කිරීම පිළිබඳව එතුමන්ලාගේ විරුද්ධත්වයක් නෑ කියන එක තමයි එතුමන්ලාගේ, සමස්ත සභාවේ අයිතිය පිළිබඳවත් ඉදිරිපත් වෙන ආකාරයට තමයි යෝජනා දෙක ඉදිරිපත් කළේ. ඒ අනුව විපක්ෂනායකතුමා විසින් ඉදිරිපත් කරන්නේ මේ කාරණාව පිළිබඳව, ඒ සංශෝධන දෙකට එකඟයි. සංශෝධන දෙකට එකඟව මේ කාරණාව පිළිබඳව සම්මත කිරීම පිළිබඳව ගැටළුවක් පැන නගින්නේ නෑ කියලා. ඒ අනුව මේ පිළිබඳව ඡන්ද විමසීමකට අපි යන්න බලාපොරොත්තු වෙන්නේ නෑ. ඒ අනුව ගරු ප්‍රධාන ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන දෙකට යටත්ව මේ ඉදිරිපත් කරන ලද තිරසාර සංවර්ධනය පිළිබඳ පනත් කෙටුම්පත් පිළිබඳ යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත කරපු ආකාරයට මේක සභාව විසින් අනුමත කරපු බවට අපි දන්වා යැවීමට කටයුතු කරනවා. සංශෝධන සහිතව.

**පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු .**

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ගරු අසෝක ජයවර්ධන සභානායකතුමාගේ යෝජනාව.

***ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.***
***கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன***
*Hon.Gov.Whip Asoka Jayawardane*
-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මේ සභාවේ කටයුතු එකිනෙක විධිමත් කරමින් ඔබතුමා අපේ සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ දී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාත්, විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාත් සමඟ සාකච්ඡා කරපු අවස්ථාවක අපි ඇති කරගත්තු එකඟතාවය අනුව මා මේ යෝජනාව ඉදිරිපත් කරනවා.

සභාපතිතුමනි, 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සහ 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ සඳහන් නොවන නමුත් පළාත් සභාවන්හි කාර්යයන් ඉටු කිරීම සඳහා වර්තමානය වනවිට අත්‍යාවශ්‍යවී ඇති පළාත් සභා විපක්ෂනායක, සභානායක, ආණ්ඩු පක්ෂ සංවිධායක සහ විපක්ෂ සංවිධායක යන තනතුරු අනුමත තනතුරු බවට නීත්‍යානුකූල ලෙස පත් කරන ලෙසත්, ‘‘පළාත් සභා සභාපති‘‘ යන නාමය ‘‘පළාත් කථානායක‘‘ ලෙසත්, ‘‘පළාත් සභා නියෝජ්‍ය සභාපති‘‘ යන නාමය ‘‘පළාත් නියෝජ්‍ය කථානායක‘‘ ලෙසත් සංශෝධනය කරන ලෙසත්, ඒ සඳහා පළාත් සභා පනත සංශෝධනය කරන ලෙසත්, මධ්‍යම රජයෙන් ඉල්ලා සිටිය යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කරමි. ස්තුතියි !

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තුතියි ! ගරු සභානායකතුමනි. මීළඟට ගරු අජිත් කුමාර මැද්දේගම මැතිතුමා.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*

-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, අපේ සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා ගෙනාපු යෝජනාව අපේ පළාත් සභාවට ඒ බලය නැති වුනත් ඒ තනතුරු ස්ථාවර තනතුරු හැටියට පත් කරන්න ඒ යෝජනාව ඉතාම කාලෝචිතයි. අවශ්‍යයි. අපි සමහරවිට බැලුවොත් ප්‍රාන්ත ක්‍රමය සහ විශේෂයෙන් ක්‍රියාත්මක වෙන පළාත් සභා ක්‍රමය ඉන්දියාවේ සමහර ප්‍රාන්තවල කථානායකවරු සිටිනවා. සමහර තැන්වල පළාත් කථානායකවරු නෑ. ඒ වගේම පාර්ලිමේන්තුත් තිබෙනවා. හැබැයි අපේ පළාත් සභාව තුළ සභාපති කියන වචනය පාවිච්චි කරනකොට හැම සභාවකම ඉන්නේ සභාපතිවරයෙක්. ඒ නිසා පළාත් සභාව කියන තැන ඊට වඩා විශේෂ තැනක් ගන්නවා පාර්ලිමේන්තුව වගේ. ඒ නිසා ඒ යෝජනාව ඉතාම කාලෝචිතයි.

ඒ වගේම පළාත් සභාව විසින් නාමික වශයෙන් පත්කරගෙන තිබෙන්නා වූ තනතුරු ඒ කීපයත් පනතට ඇතුල් කරනවා නම් ඒක ඉතාම කාලෝචිතයි කියන එක අපේ අදහස. ඒ නිසා අපේ සම්පූර්ණ එකඟතාවය පළ කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි ! අජිත් කුමාර මැද්දේගම මන්ත්‍රීතුමනි. ගරු අසෝක ජයවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ සඳහන් නොවන නමුත් පළාත් සභාවන්හි කාර්යයන් ඉටු කිරීම සඳහා වර්තමානය වනවිට අත්‍යාවශ්‍ය වී ඇති පළාත් සභා විපක්ෂනායක, සභානායක, ආණ්ඩු පක්ෂයේ සංවිධායක සහ විපක්ෂයේ සංවිධායක යන තනතුරු අනුමත තනතුරු බවට නීත්‍යානුකූල ලෙස පත් කරන ලෙසත්, පළාත් සභා සභාපති යන නාමය පළාත් කථානායක ලෙසත්, පළාත් සභා නියෝජ්‍ය සභාපති යන නාමය පළාත් නියෝජ්‍ය කථානායක ලෙසත් සංශෝධනය කරන ලෙසත්, ඒ සඳහා පළාත් සභා පනත සංශෝධනය කරන ලෙසත් මධ්‍යම රජයෙන් ඉල්ලා සිටිය යුතුයැයි කියන එක තමයි ගරු අසෝක ජයවර්ධන මැතිතුමා විසින් යෝජනා කළේ. ඒ පිළිබඳව ඒ යෝජනාව සම්මත කරමින්, එකඟත්වය පළ කරමින් විපක්ෂය වෙනුවෙන් ගරු අජිත් කුමාර මැද්දේගම මැතිතුමා විසින් ගරු විපක්ෂය විසින්ම එම යෝජනාව අනුමත කරන බවත්, ඒ යෝජනාවේ සඳහන් කරුණු ක්‍රියාත්මක කළයුතුයි කියන එකත් සඳහන් කළා. ඉතින් මේ කාරණා පිළිබඳව මේ වනවිට පළාත් සභා සභාපතිවරුන්ගේ සම්මේලනයේ දී අවස්ථා කීපයකදීම සාකච්ඡා කළා. අනෙකුත් පළාත් සභා ගණනාවකම මේ වෙනකොට මේ යෝජනාව සම්මත කරලා, අනුමත කරලා මේ වෙනකොට පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයටත්, ඒ වගේම යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කමිටුවටත් මේ වෙනකොට ඉදිරිපත් කරලා තියනවා. මොකද මේ වෙනකොට රටේ නව ව්‍යවස්ථාවක් ඉදිරිපත් කිරීම සඳහා සංශෝධන ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත් කරලා ඒ පිළිබඳව ඒ කමිටුව සාකච්ඡා කරමින් ඉස්සරහාට යන මොහොතක්. ඒ අනුව ඒ නව සංශෝධන ඉදිරිපත් කරන අවස්ථාවේ දී විශේෂයෙන්ම ගරු අසෝක ජයවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරන

ලද යෝජනාව, මේ තනතුරු විශේෂයෙන්ම විපක්ෂනායක තනතුර, සභානායක තනතුර, ආණ්ඩු පක්ෂ සංවිධායක, විපක්ෂ සංවිධායක කියන තනතුරු සම්මත තනතුරු බවට පත් නොවීම තුළ සභාව තුළ කටයුතු කරගෙන යාමේ දී බරපතල නෛතික වශයෙන් සමහර වෙලාවට අර්බුදවලට ලක්වෙන අවස්ථා තිබෙනවා. ඉතින් ඒ නිසා සමහර තනතුරු පත් කිරීම තුළින් පෞද්ගලික කාර්යය මණ්ඩල පත් කිරීම සම්බන්ධයෙන්, ඒ අයගේ දීමනා හා ප්‍රවාහන පහසුකම් ලබාදීම සම්බන්ධයෙන් බරපතල අර්බුද ඇතිවෙන තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා තමයි එතුමා ඒ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ, මේක නීත්‍යානුකූලව භාණ්ඩාගාරය විසින් අනුමත කරන ලද තනතුරු බවට පත් කිරීමට කටයුතු කරන්න කියලා.

ඒ වගේම පළාත් සභා සභාපති සහ නියෝජ්‍ය සභාපති කියන තනතුරු දෙක ගරු අජිත් කුමාර මැද්දේගම මැතිතුමා පැහැදිලි කරපු ආකාරයට ඒක පාර්ලිමේන්තුවේ කථානායක තනතුර නම් නියෝජනය කරන්නේ පළාත් කථානායක වැනි තනතුරක් යෝජනා කරමින් එවැනි වූ නමක් සම්මත කරන්න කියන එක තමයි ඒ ඉල්ලීම බවට පත්වෙලා තිබුනේ. ඒ නිසා ඒ ඉල්ලීම් දෙකම, ගරු අසෝක ජයවර්ධන මැතිතුමා විසින් යෝජනා කරලා ගරු අජිත් කුමාර මැද්දේගම මැතිතුමා විසින් ස්ථිර කරන්න යෙදුනා. ඒ නිසා එය සභාව විසින් අනුමත කරන ආකාරයට ගරු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා හා අමාත්‍යවරයා වෙතත්, ඒ වගේම යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්තමාන කමිටුවටත්, ඒ වගේම අතිගරු ජනාධිපතිතුමාටත්, ඒ වගේම ගරු අග්‍රාමාත්‍යතුමාටත් දන්වා යැවීමට කටයුතු කරන බව ගරු සභාවට දැනුම් දෙනවා.

මීළඟට ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා අංක 6/1/2017/2 දරණ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබාදෙනවා. මන්ත්‍රීතුමා සභාවේ නෑ. එම යෝජනාව ඉදිරි දිනයක දී සාකච්ඡා කිරීම සඳහා යොමු කරනවා.

ඊළඟට ගරු විපක්ෂයේ සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2017/3 දරණ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා දැන් අවස්ථාව ලබාදෙනවා.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*

-----------------------------------------------------

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව ඊළඟ වාරයට ගන්න කල් තබන ලෙස ඉල්ලා සිටිනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------

ස්තුතියි ! ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි. ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ඔබතුමාගේ ඉල්ලීම පරිදි ඊළඟ සභාවේ දී සාකච්ඡා කිරීම සඳහා අපි ඉඩකඩ ලබාදෙනවා.

**සභාව කල් තැබීම :**

*ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.*
*கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன*
*Hon.Gov.Whip Asoka Jayawardane*
---------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මෙම ගරු සභාව 2017 පෙබරවාරි 28 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබන ලෙස මම යෝජනා කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

ස්තුතියි ! ගරු සභානායකතුමනි, ඔබතුමාට.

**සභාව කල් තබන අවස්ථාවේ යෝජනා :**

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

සභාව කල් තබන අවස්ථාවේ යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ගරු ආරියවංශ බාලසූරිය මැතිතුමාට අවස්ථාව.

*ගරු මන්ත්‍රී බී.ආරියවංශ*
*கௌரவ உறுப்பினர் பீ.ஆரியவங்ஷ* *Hon.Member B.Ariyawansha* ------
---------------------------------------

ගරු සභාපතිතුමනි, සභාව කල් තබන අවස්ථාවේ දී මගේ හදිසි යෝජනා කීපයක් ඉදිරිපත් කරනවා මේ අවස්ථාවේ දී. මේ අවස්ථාවේ දී සඳහන් කරන්න ඕන ඇඹිලිපිටිය ප්‍රදේශයේ, ඇඹිලිපිටිය නගරය ආශ්‍රිතව මේ වෙනකොට රහසිගත ලෙස කුඩු ව්‍යාපාරය ක්‍රියාත්මක වෙමින් පවතිනවා. මත්කුඩු ව්‍යාපාරය පිළිබඳව අපි ඒ ප්‍රදේශයේ පොලිස් ස්ථානය දැනුවත් කරලා තියෙන්නේ. ඒත් මේ වෙනකොට ඒ ප්‍රදේශයේ පාසල් දරුවන්, ඒ වගේම උපකාරක පන්ති සඳහා සහභාගී වෙන සිසුන්, ඒ වගේම තරුණ ප්‍රජාව ඉලක්ක කරගෙන නගරය අවට ස්ථාන කීපයක මේ වෙනකොට සීඝ්‍ර ලෙස මෙය වර්ධනය වෙමින් පවතිනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම මේ ගරු සභාවෙන් ඉල්ලා සිටින්නේ මේ පිළිබඳව දැනුවත් කරලා මේ මත්කුඩු ජාවාරමින් මේ ප්‍රදේශයේ තරුණයින් බේරා ගැනීම සඳහා හැකි වැඩ පිළිවෙලක් සකස් කරන ලෙසත්, ඒ වගේම ඒ පිළිබඳව දැනුවත් කරන ලෙසත්. ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, මේ වෙනකොට මොරකැටිය ප්‍රදේශයේ පාසල් අසළ, ඒ වගේම ඇඹිලිපිටිය නව නගර ප්‍රදේශයේ, වැව් ආසිරිගම ප්‍රදේශයේ, ඒ වගේම ඇඹිලිපිටිය උඩගම ප්‍රදේශයේ තමයි විශාල වශයෙන් මේ පාසල් ආශ්‍රිතව තමයි මේවා ඊසිකැෂ් ක්‍රමයට, මුදල් ගෙවලා ඒ ජාවාරම කරගෙන යන්නේ. ඒ නිසා මේ ප්‍රදේශයේ ඒ ජාවාරමට හවුල් පිරිසකුත්, ඒ වගේම පිට ප්‍රදේශවලින් මේ ප්‍රදේශයට මත්කුඩු ප්‍රවාහනය කරන පිරිසකුත් සිටිනවා. මේ පිළිබඳව පොලීසිය දැනුවත් වෙලා තියෙන්නේ. දැනුවත් වුනාට අපි පසුගිය දා දැක්ක විදිහට ඒ පිළිබඳව විශේෂ

අවධානයක් යොමු නොකිරීම හේතුවෙන් තමයි අද මේ තත්ත්වය උදාවෙලා තියෙන්නේ.

ඒ වගේම ගරු සභාපතිතුමනි, දෙවෙනි යෝජනාව වශයෙන් ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ භාගල ග්‍රාමසේවා වසමේ කරවිලයාය පාසල අසළ පාළමේ ඇදි නෑ. මේ වෙනකොට ඒ ප්‍රදේශයේ අනතුරු කීපයක් ඒ ස්ථානයේ සිදුවෙලා තියනවා. කරවිලයාය ප්‍රදේශයේ වාහන කීපයක්ම අනතුරට ලක්වෙලා තියනවා. ඒ වගේම පාසල් යන ළමුන්ට ඉතාම අනාරක්ෂිත විදිහට තමයි මේ මාර්ගයේ පාළම තියෙන්නේ. ඒ නිසා හැකි ඉක්මණින් ගරු සභාපතිතුමනි, මේ මාර්ගයේ තිබෙන මේ පාළමට ඇදි සකස් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, තුන්වෙනි යෝජනාව වශයෙන් ඇඹිලිපිටිය ප්‍රදේශයේ පනාමුර අවට රංචමඩම ප්‍රදේශයේ මේ වෙනකොට ඒ ප්‍රදේශයේ ගොවීන් විශාල පිරිසක් පැඟිරි වගාවේ නිරතවෙලා ඉන්නවා. රු1,100/- ට, 1,200/- ට තිබුණ පැඟිරි කිලෝ එක රු.11,000/- දක්වා පසුගිය දවස්වල වැඩි වුනා. ඒත් හිටි ගමන්ම මේ වෙනකොට ඒ වැඩිවීමත් සමඟ විශාල ගොවීන් ප්‍රමාණයක් ඒ ප්‍රදේශයේ ඉඩම්වල පැඟිරි වගා කළා. එක්කෙනා අක්කර 2, 3, 5 වගේ පැඟිරි වගා කරලා විශාල වශයෙන් ඒ ප්‍රදේශයේ ගොවි තැනේ නියැලී සිටින ගොවීන්ට මේ වෙනකොට හිටි ගමන්ම රු.3,000/- දක්වා පැඟිරි කිලෝ එකක මිළ අඩුවීම නිසා ඒ ප්‍රදේශයේ ගොවීන් විශාල ලෙස අපහසුතාවයට පත් වෙලා තියනවා. මොකද තමන්ගේ පැඟිරි නොකපා මේ වෙනකොට පැඟිරි බොයිලේරු වසා දමන තත්ත්වයට පත්වෙලා තියෙනවා. ඒ නිසා ඇඹිලිපිටිය, පනාමුර, රංචමඩම, ඒ වගේම කොලොන්න ප්‍රදේශවල විශාල පිරිසක් ඒ පැඟිරි කර්මාන්තයෙන් තමයි ජීවත් වෙන්නේ. මොකද ඒ ප්‍රදේශ වෙනත් භෝග වගා කිරීමට නොහැකි ප්‍රදේශ නිසා. ඒ නිසා ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා හෝ මේ පිළිබඳව දැනුවත් කරලා මේ ප්‍රදේශයේ ගොවීන්ගේ පැඟිරි තෙල් අළෙවි කර ගැනීම සඳහා යම් වැඩ පිළිවෙලක් සකස් කළොත් හොඳයි කියලා මම මේ අවස්ථාවේ දී යෝජනා කර සිටිනවා. ස්තුතියි !

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තුතියි ! ගරු ආරියවංශ බාලසූරිය මැතිතුමාට. ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා අදාළ අංශ වෙත දන්වා යැවීමට කටයුතු කරනවා. මීළඟට ගරු වරුණ ලියනගේ මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී වරුණ ලියනගේ*
*கௌரவ உறுப்பினர் வருண லியனகே* *Hon.Member Waruna Liyanage*
------------------------------------------------------

ගරු සභාපතිතුමනි, ඉස්සෙල්ලා අපේ අසෝක ජයවර්ධන ආණ්ඩු පක්ෂයේ සභානායකතුමා විසින් කරන ලද යෝජනාව හා සම්බන්ධව කරුණු පොඩ්ඩක් පැහැදිලි කරන්න ඕන. මොකද අපි ව්‍යවස්ථාව සම්බන්ධයෙන්, සංශෝධන සම්බන්ධයෙන් සාකච්ඡාවක් කළා පහුගිය මාසයේ, සියළුම මන්ත්‍රීවරුන්ට එන්න කියලා. නමුත් ඒකට සහභාගී වෙන්න බැරි වුනා අපේ සියළුම මන්ත්‍රීවරුන්ට. ඒ නිසා අපි නැවතත් ඔබතුමාගෙන් ඉල්ලන්නේ

නැවතත් ඒ සාකච්ඡාව සියළුම මන්ත්‍රීතුමන්ලාට පළාත් සභාවේ ආපහු නැවතත් අවස්ථාවක් දෙන්න. මොකද ඉතාම වැදගත්. මොකද අපි කීප දෙනෙක් විතරක් කථා කරලා යවනවාට වඩා හොඳයි අපි සියළුදෙනා සාකච්ඡා කරලා යවන එක. එදත් අපි කථා කළේ ඒක. සියළුදෙනාම ඉන්න ඕන කියලා. ඒ නිසා අපි මහ ඇමතිතුමාගෙනුත් ඉල්ලීමක් කළා. ඒ නිසා ඒකට ඔබතුමා මැදිහත් වෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අපේ සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ගැනත් අපි කථා කරන්න හිටියා මමත්, අකිල මන්ත්‍රීතුමාත්. මොකද අත්‍යාවශ්‍ය කාරණයක් මේ තාක්ෂණ විද්‍යාපීඨය සම්බන්ධයෙන්. මොකද මේ අවුරුද්දේ ඒ දේ වෙන්න ඕන නිසා, මොකද මාසෙන් මාසේ මේක ගැටළුවක් එයි. ඒක ගැනත් අවධානය යොමු කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මැණික් සංස්ථාව සම්බන්ධයෙන් කථා කරන්න තමයි මම ඔබතුමාගෙන් අවසර ඉල්ලුවේ. ඇත්තටම ගරු සභාපතිතුමා, මේ වෙනකොට මැණික් සංස්ථාවෙන් ලයිසන්ස් දීමේ දී නීත්‍යානුකූලව ලයිසන්ස් එක දෙනකොට පත්ඉරු ඉල්ලනවා. එතකොට පත්ඉරු ඉල්ලන ඉල්ලීමේ දී විශාල ගැටළු රාශියකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා, අපේ ලයිසන්ස් ඉල්ලන හිමිකරුවන්ට. ඒ නිසා මේ වෙනකොට ලයිසන්ස් දීමේ ප්‍රවනතාවය අඩුවීම නිසා විශාල ගැටළුවක් අපේ පතල් කම්කරුවන්ට ඇති වෙලා මේ වෙනකොට ලයිසන්ස් සාමාන්‍යයෙන් ගත්තාම පස්සේ රත්නපුර කාර්යාලයේ පමණක් දෙසීයකට ආසන්න ප්‍රමාණයක් ලයිසන්ස් නැතුව නතර වෙලා තියනවා. එතකොට දෙසීයක් ගත්තොත් ගරු සභාපතිතුමා, ලයිසන්ස් නැවතුනොත් කම්කරුවෝ සාමාන්‍යයෙන් දෙදහස් හාරසියයකට විතර ප්‍රමාණයකට තමන්ගේ කර්මාන්තය කරගන්න බැරි වෙනවා. අවුරුද්ද එනවා. එතකොට ආයේ ලයිසන්ස් එකක් ගන්නෙ නෑ. ආයේ අවුරුද්දෙන් පස්සේ එන්නේ. ඒ නිසා අහිංසක කම්කරුවෝ විශාල ප්‍රමාණයකට අද පතල් කර්මාන්තය අහිමි වෙලා මේ අළුත් ලයිසන්ස් දීමේ වැඩ පිළිවෙල නිසා. ඉතින් ඇත්තටම ගරු සභාපතිතුමා, අපේ මැණික් සංස්ථාව ගත්තාට පස්සේ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ලංකාවටම අයිති කාරණයක්. එතකොට ලංකාවේම ගත්තාම මේ වෙනකොට 1000 කට ආසන්න සංඛ්‍යාවක් ලයිසන්ස් නැති වෙලා තියනවා මේ පත්ඉරු ඉල්ලීම නිසා. එතකොට 1000 ක් ගත්තාම 12,000 යි. ඒ නිසා විශාල ප්‍රශ්නයක් රටේම තියනවා. මොණරාගල, බිබිල මේ සියළුම පැතිවල. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ පත්ඉරු දෙන්නම ඕන කියලා කියන්නේ මේගොල්ලෝ අර ජෙම්ෆීල් කියන ආයතනයෙන් විදේශ කම්පනි එකක් ඇවිල්ලා මෙහේ පතල් කර්මාන්තයේ නියැලෙන්න ඕන කියන නිසා තමයි මේ පත්ඉරු ඉල්ලන්නේ. හැබැයි ලයිසන්ස් එකේම පිටිපස්සේ ගහලා තියනවා සංස්ථාවේ සභාපතිතුමාට ඕනෑම තීන්දුවක් ගන්න පුළුවන් ලයිසන්ස් එක සම්බන්ධයෙන්. අත්හිටුවන්න පුළුවන්. එතකොට ඒක මුවාවෙන් මේ පත්ඉරු ඉල්ලන්න ගිහාම පස්සේ කර්මාන්තයට විශාල අසාධාරණයක් වෙලා තියනවා ගරු සභාපතිතුමනි. ඉතින් ඒ නිසා ලයිසන්ස් එකේම පිටිපස්සේ ගහලා තියනවා නම් සභාපතිතුමාට ඕනෑම තීරණයක් ගන්න පුළුවන් කියලා ඒක හඳුනා ගත්තොත්, කවුරු හරි කිව්වොත් මේක ජෙම්ෆීල් ආයතනයෙන් කපන පතලයක් කියලා මේක නවත්වන්න හැකියාව තිබෙන අතරේ මේ පත්ඉරු ඉල්ලන නිසා විශාල අසාධාරණයක් ඇතිවෙලා මේ වෙනකොට කර්මාන්තයේ ක්‍රියාව කරන කම්කරුවට

රස්සාව නැතිවෙලා තියනවා. එතකොට ව්‍යාපාරිකයාට අද විශාල අඩුවක් තියනවා මේ මැණික් එළියට ඒමේ. ඒ නිසා විශාල ප්‍රශ්නයක් වෙලා තියනවා ව්‍යාපාරිකයා, සුළු මැණික් ව්‍යාපාරිකයාගේ ඉඳලා සියළුමදෙනාට. ඉතින් ඒ නිසා ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ මෙම පත්ඉරු දෙන වැඩ සටහන තාවකාලිකව නවත්වලා ක්‍රියාත්මක වෙන්න වෙනවා. මොකද අවුරුද්දට ඉස්සෙල්ලා ලයිසන්ස් එක දෙන්න බැරි වුනොත් ඒගොල්ලන්ට මුදලක් හොයාගන්න බැරි වෙනවා. ඒ නිසා ඔබතුමා මේකට මැදිහත් වෙන්න කියලා ඉල්ලා සිටිමින්, අවස්ථාව දීපු එකට ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි !

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ස්තුතියි වරුණ ලියනගේ ගරු මැතිතුමනි. ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා දෙක, පළවෙනි යෝජනාව පිළිබඳව අපි අදාල ආයතන වෙත යොමු කරලා අවස්ථාවක් ලබාගැනීම සඳහා ඉදිරි කටයුතු කර ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අපි ඔබතුමාව දැනුවත් කිරීමට කටයුතු කරනවා. මෙය ඉතාම කඩිනමින් ඉටු කළ යුතුයි කියලා පළාතටම අපේ දිස්ත්‍රික්කයේ බහුතරයටම බලපාන ඉතාම වැදගත් වූ කාරණාව පිළිබඳව අදාල අමාත්‍යාංශය ඒවගේම අදාල ආයතනය ආයතන ප්‍රධානින් වෙත දන්වා ඒ සඳහා විධිමත් ලෙස කඩිනමින් කටයුතු කිරීමට අවශ්‍ය මැදිහත්වීම කරන බව ඒ සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග ඔබතුමා දැනුවත් කරන බවත් ඔබතුමාව දැනුවත් කරනවා.

මීළඟට කේ.එල්.රත්නායක ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක*
*கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக* *Hon.Member K.L.Ratnayake* ----------
---------------------------------------

ගරු සභාපතිතුමනි කාරණා දෙකක් මගේ හිතේ වරුණ ලියනගේ ගරු මන්ත්‍රීතුමා මතු කරපු ප්‍රශ්නයත් මේ වෙලාවේ බලපානවා. අපි පළාත් සභාවට ගෙනල්ලා සභාපතිතුමා නිළධාරීන් මැණික් සංස්ථාවේ සාකච්ඡා කළා. කිසිම එළයක් වුනේ නෑ. හැබැයි ගරු සභාපතිතුමනි නිළධාරීන් එක්කෙනෙක්ගේ දෙන්නෙක්ගේ වුවමනාවට තමයි මැණික් සංස්ථාවේ කටයුතු දුවන්නේ. බල්ලා නැට්ට වනනවා නෙමෙයි . නැට්ටෙන් බල්ලා වනනවා වගේ තමයි මට නම් දැනෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි මගේ තනි අයිතිය තියෙන ඉඩමට මාස දෙක හමාරක් ගියා බලපත්‍රය ගන්න. එතකොට හවුල් තියෙනවා නම් 25 දෙනෙකුට මාස හයකට එහා යයි ලයිසන් එක ගන්න. මේ නිසා ගරු සභාපතිතුමනි මේ කොච්චර කතා කළත් මම දකින්නේ නම් පරිසර අමාත්‍යවරයා හැටියට විෂයභාර අමාත්‍යවරයා හැටියට අතිගරු ජනාධිපතිතුමාත් එක්ක අපිට සාකච්ඡාවක් ඉල්ලලා දෙන්න මේ රත්නපුරේ පතල් කර්මාන්තය රැක ගන්න ක්‍රමවේදයක් සාකච්ඡා කරන්න. නැත්නම් මේකට කොච්චර කතා කළත් මේකට හරි උත්තරයක් එන්නේ නෑ ගරු වරුණ ලියනගේ මන්ත්‍රීතුමා. ඒ නිසා ගරු සභාපතිතුමනි මම ඔබතුමාගෙන් ඉල්ලනවා ජනාධිපතිතුමා මුණ ගැහිලා අපිට සාකච්ඡා කරන්න අවස්ථාවක් ලබා

දෙන්න ප්‍රධාන ඇමතිතුමා එක්ක සාකච්ඡා කරලා.

ඊළඟ කාරණාව තමයි ගරු සභාපතිතුමනි දැන් මේ පෙබරවාරි මාසයේ අද 07 වෙනිදා. ඉස්කෝලය පටන් ගත්තේ ජනවාරි 02 වෙනිදා. ප්‍රාථමික අංශය ගත්තහම මම ගිය අයවැයට ඉස්සෙල්ලා ඉල්ලීමක් කළා. ඇහැලියගොඩ ප්‍රාථමික විද්‍යාලයටත් එක වසර පංතියක් වැඩි කරලා දෙන්න කියලා. දැන් මේ වෙන කොට ගරු සභාපතිතුමනි ඇහැලියගොඩ ප්‍රාථමික විද්‍යාලයේ ලකුණු 95 ගත්ත දරුවෝ විශාල ප්‍රමාණයක් එළියේ ඉන්නවා පෝෂික කලාපය තුළ. එතකොට මේ පෝෂිත කලාපය කිව්වහම ඔබතුමා දන්නවා ඇහැලියගොඩ අගුරුවාමුල්ල කියන ප්‍රදේශය. මීටර් 150 ක් ඇති අගුරුවාමුල්ල කියන ප්‍රදේශයට. ලකුණු 95 ගත්ත දරුවෝ ටික පාසැලට ඇතුලත් කර ගන්න බැරුව. හේතුව තමයි ඔප්පු නැති කතාව. ප්‍රධාන අමාත්‍යවරයා අධ්‍යාපන අමාත්‍යවරයා හැටියට කටයුතු කරන අවස්ථාවේ ඔබතුමාට මතක ඇති පවිත්‍රා වන්නිආරච්චි මැතිණිය ආසන සංවිධායකවරිය හැටියට අපි සියළු දෙනා ඇහැලියගොඩ දේශපාලන අධිකාරිය කැඳවලා ප්‍රධාන අමාත්‍යවරයාත් එක්ක සාකච්ඡාවක් තිබ්බා. එදා මං ප්‍රධාන අමාත්‍යවරයාට මතු කළා ඔප්පු,ලයිට් බිල,ඒවගේම වතුර බිල මතු කළා. මෙතුමා අධ්‍යාපන ඇමතිවරයා හැටියට එතුමා කිව්වේ ඔප්පු ගැන බලන්න එපා පෝෂිත කලාපයේ ළමයි ටික ගන්න කියලා. ඉතිං මේ වෙන කොට ළමයි මීටර් 150 ක් තුළ ළමයි ටික ගන්නේ නෑ. හැබැයි මීටර් 250 ක් දුර ඉන්න ළමයි කීප දෙනෙක් අරන් තියෙනවා. විදුහල්පතිතුමාට කතා කළහම කියනවා කලාපයට ඇරලා තියෙනවා අනුමැතියට කියලා. එතකොට පෙබරවාරි 07 දෙමව්පියෝ බලාගෙන ඉන්නවා දරුවෝ ටික දාගන්න. මේ පෝෂිත කලාපයේ දරුවෝ ටික ගන්නේ නැතුව පිට අය ගන්නේ කොහොමද. ඒ අය කියනවා පෝෂිත කලාපයේ ඉන්න අය උඩුමත්තට දාන්න කියලා. එහෙම නිති දෙකක් බෑ. ගරු සභාපතිතුමනි පහුගිය දවස්වල විදුහල්පති විභාගය ලියපු විදුහල්පතිවරු ඉන්නවා. මේ ශ්‍රේණියක් නැති විදුහල්පතිවරයෙක් හැටියට. මේ මම පෞද්ගලිකව තරහ නෙමෙයි. මම කියන්නේ එහෙම නම් හොඳ විදුහල්පතිවරයෙක් දාන්න මේ තීන්දු තීරණ ගන්න බැරි නම්. එහෙම නම් මේ වැඩක් නෑනේ. එක වසරට යන දරුවෝ ටික තව ගෙදර නම් පෝෂිත කලාපයේ ඉන්න දරුවෝ ටික ගෙදර නම් පෝෂිත කලාපයෙන් එහා ඉන්න දරුවෝ ටික පාසැල් යනවා නම්. අර ළමයින්ගේ මානසිකත්වය මොකක්ද. ඒ නිසා ගරු සභාපතිතුමනි මේකට තීන්දුවක් ගන්න ඕනේ අධ්‍යාපන අමාත්‍යතුමා අද නෑ. ප්‍රධාන අමාත්‍යතුමාගෙන් මම විශේෂ ඉල්ලීමක් කරනවා. මොකද එතුමා තීන්දුවක් ගත්තොත් මේක හරියට ක්‍රියාත්මක කරනවා. ඒ නිසා මේ පෝෂිත කලාපයේ දරුවෝ ටික ගන්න. ප්‍රධාන ඇමතිතුමා ඔබතුමා මැදිහත් වෙන්න කියලා මම ගෞරවනීය ඉල්ලීම කරනවා. මොකද ඔබතුමාට ස්තූති කරන්නත් ඕනේ ඇරැපොළ ප්‍රාථමික විද්‍යාලයේ ආරම්භ කරන්නත් ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා ඔබතුමාගේ මැදිහත්වීම මත තමයි ඒකත් පටන් ගත්තේ ඒක නිසා ගරු ප්‍රධාන ඇමතිතුමනි ඔබතුමාට ඒ ස්තූතිය පිරි නමන ගමන් ඇහැලියගොඩ ප්‍රාථමික විද්‍යාලය මේ ලකුණු 95 සීමාවේ ඉන්න 94 සීමාවේ ඉන්න, එක්කෝ 90 සීමාවේ ඉන්න පෝෂිත කලාපයේ ඉන්න ළමයි ටික ගන්න අවශ්‍ය කටයුතු කර දෙන මෙන් ගෞරවනීය ඉල්ලනවා. බොහොම ස්තූතියි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ස්තූතියි ගරු කේ.එල්.රත්නායක ගරු මන්ත්‍රීතුමනි. ඔබ තුමා විසින් ඉදිරිපත් කරන ලද කාරණා දෙක පිළිබඳව ඉදිරි කටයුතු කිරීම සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමා සමගත් අධ්‍යාපන ලේකම්තුමා සමගත් සාකච්ඡා කරලා ,අමාත්‍යතුමා සමගත් සාකච්ඡා කරලා ඉදිරි කටයුතු කිරීමට පියවර ගන්නා බව දැනුම් දෙනවා. මීළඟට විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමා.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*
------------------------------------------------------

ගරු සභාපතිතුමනි රත්නායක ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව කතාව සම්බන්ධයෙන් තමයි මටත් කතා කරන්න තියෙන්නේ. ගරු සභාපතිතුමනි රත්නායක ගරු මන්ත්‍රීතුමා කියාපු ආකාරයට පාසැල් තුනක් සම්බන්ධයෙන් තමයි කතා කරන්නේ ගරු සභාපතිතුමනි. ධර්මපාලයේ ප්‍රාථමිකය ගත්තහම මෙතුමා කියාපු ආකාරයට 90 එහා ගත්තහම ළමයි ඉන්නවා 29 දෙනෙක්. මම එදාත් මේක යෝජනායක් වශයෙන් අපේ අධ්‍යාපන ඇමතිතුමාට දුන්නා ගරු සභාපතිතුමනි පංතියක් වැඩි කරලා දෙන්න කියලා. පංති අටක් තිබුණා ගරු සභපතිතුමනි. ඇහැලියගොඩ ධර්මපාල ප්‍රාථමිකය ගරු සභාපතිතුමනි පංති දහයක් පැවැත්වූවා. දහය ටක් ගාලා හයට බැස්සුවා. හයට බැස්සුවාට පස්සේ අපි කියලා කියලා තව එක පංතියක් වැඩි කර ගත්තා. අද මේ වෙන කොට ළමයි 29 දෙනෙකුට ධර්මපාල ප්‍රාථමිකය ආවේනික අපි පිටස්තර ළමයි ගැන කියන්නේ නෑ. ආවේනික ළමයි 29 ක් මේකේ ඉන්නවා. වෙනත් පාසැලක් නැතුව. 90,91,92,93,94,95 දක්වා තමයි 95 ලකුණු මට්ටම 96 යි. 95 ගත්ත හය තමයි වැඩි හරියක් ඉන්නේ. මේ පංතියක් වැඩ කරලා දෙන්න කිව්වහම මේ අධ්‍යාපනය ගැන හිතන බලන අය විශේෂම අවධානය යොමු කරන්න. එදා දුන්න යෝජනාව අධ්‍යාපන ඇමතිතුමාට මේ වෙන කොට ක්‍රියාත්මක වෙලා ඇති කියලා. ඒකේ ක්‍රියාත්මක නොවීම ගැන ගරු සභාපතිතුමනි මගේ කණගාටුව ප්‍රකාශ කරනවා. ඒ එක්කම දෙහෙරගොඩ කණිෂ්ඨයේ ඔය ප්‍රශ්නයම මතු වුණා කිව්වහම පංතියක් ලබාදීම පිළිබඳව ස්තූතිය ප්‍රකාශ කරනවා ගරු සභාපතිතුමනි. ඒ එක්කම ගරු සභාපතිතුමනි කිරිඇල්ල දේවරක්ෂිත විද්‍යාලය ගත්තහම ඒකෙත් මේවගේ ප්‍රශ්නයක් තියෙනවා. කිරිඇල්ලත් දේවරක්ෂිත ආවේනික ළමයි. මේ අයට තමයි පංතියක් නැත්තේ. මෙන්න මේ පංති දෙක වැඩ කරලා දෙන්න කියලා මේ දෙමව්පියෝ ඉල්ලන ඉල්ලීම සාධාරණයි. ඒ පාසැලට ආවේනික ළමයි කොහේද යන්න පාසැලක්. වෙන පාසැලක් නෑනේ. ඒ ළමයාට දෙන්න ඕනේ. එහෙම නැත්නම් මානව හිමිකම් උල්ලංඝණය කිරීමක් මේක. මේ නිසා නැවත වාරයක් කියන්නේ ලිඛිව ගරු අධ්‍යාපන ඇමතිතුමාට දුන්නු ප්‍රශ්නය අපිට පිළිතුරකුත් නැති අතර ක්‍රියාත්මක නොවීම ගැන කණගාටුව ප්‍රකාශ කරන අතර රත්නායක ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ස්ථිර කරමින් මේ සම්බන්ධව වහාම ක්‍රියා මාර්ගයක් ගන්න. අපි ඉල්ලන්නේ වෙනත් දේකට නෙමෙයි දෙමව්පියන්ගෙන් අපිට තියෙන ප්‍රශ්නය බදාදාට හැමදාම ඇවිල්ලා මේ දෙමව්පියෝ කන්නලව් කරන්නේ දරුවන් යන්නේ කොහාටද. එතකොට අපිටත් පුරවැසිභාවය නැති මිනිස්සු ගාණට ගණන් ගන්නවා ගරු සභාපතිතුමනි

ජනතාව. ඒ නිසා විශේෂයෙන්ම සභාවට ඉස්සෙල්ලා ඇහැලියගොඩ ප්‍රාථමිකයට පංතියක් වැඩි කිරීමත් දේවරක්ෂිත විද්‍යාලයට පංතියක් වැඩි කිරීමත් කරලා දෙන්න කියලා ඉතා ඕනෑකමින් ගෞරවයෙන් ඉල්ලනවා මේ ප්‍රශ්නයට තමුන්නාන්සේලේ අවධානය යොමු කරන්න කියලා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
----------------------------------------------------------

ස්තුතියි ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල සංවිධායකතුමනි. ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉතාම කාලෝචිත පෞද්ගලිකව අපිටත් බලපාන රත්නායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ආකාරයටම අධ්‍යාපන ඇමතිතුමා සමගත් ප්‍රධාන ඇමතිතුමා සමගත් මැදිහත් වෙලා ඒ පිළිබඳව අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව දැනුම් දෙනවා. මීළගට ගරු කරුණාපාල මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල*
*கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால* *Hon.Member G.M.Karunapala*
---------
---------------------------------

මගේත් අදහස රත්නායක ගරු මන්ත්‍රීතුමා සිරිපාල කිරිඇල්ල ගරු මන්ත්‍රීතුමාගේ අදහසට එකඟව කතා කරන්නේ. අද 29 දෙනෙක් නෙමෙයි ඊට වැඩි ප්‍රමාණයක් ඉන්නවා. ඇහැලියගොඩ ප්‍රාථමික විද්‍යාලයේ ඉඳලා කිලෝමීටරයක් ඇතුළත. අල්ලපු ගෙදර ළමයා පාසැලට භාර අරගෙන අල්ලපු ගෙදර ළමයා පාසැලට භාර අරගෙන නෑ. මේ විදිහට මේ තදබදය දිගින් දිගටම ආවා. පංති දහයක් තිබුණා. අට වුණා. හත වුණා. හය වුණා. පහ වුණා. අද වර්තමාන තත්ත්වය උඩ අනිවාර්යයෙන්ම අද ළමයි 40 කට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා. තාම පාසැලට යන්නේ නැතුව ප්‍රාථමික විද්‍යාලය බලාපොරොත්තු වෙනවා. එහෙම නම් මේකට කීප වතාවක් ඉල්ලීමක් කළා. පංතියක් වැඩි කර දෙන්නට ව්‍යුහ කමිටුවේ තීන්දුක් කියයි. අරක මේක කියයි තාම තීන්දුවක් ඇවිල්ලා නෑ. ළමුන් පාසැල් යන්නේ නෑ. මෙන්න මේ ප්‍රශ්නයට විසඳුමක් ආවොතින් උඩුමත්ත මිහිඳු විද්‍යාලයේ ප්‍රශ්නයත් විසඳෙනවා. වටා පිටාවේ ප්‍රශ්නත් විසඳෙනවා. ඒ නිසා අපි දැඩි ලෙස ඉල්ලීමක් කරන්නේ නීතිය ගැනම නොසිතා දරුවන් ගැන හිතා පංතියක් වැඩි කරදීමේ කටයුත්තට එළඹෙන්න කියලා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
----------------------------------------------------------

ස්තුතියි ගරු කරුණාපාල මන්ත්‍රීතුමනි. ඔබතුමා විසින් ඉදිරිපත් කලේ ගරු රත්නායක ගරු මන්ත්‍රීතුමාත් ගරු සිරිපාල මන්ත්‍රීතුමාත් ඉදිරිපත් කළ කාරණා අනුමත කිරීම සම්බන්ධයෙන්මයි. ඒ පිළිබඳව ඉදිරි කටයුතු කිරීම සඳහා මැදිහත් වෙන බව කාරුණිකව දැනුම් දෙනවා. මීළඟට නමින්ද අනුරප්‍රිය ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය*

*கௌரவ நமிந்த அனுரபிரிய* *Hon.Member*
*Naminda Anurapriya* -----------
--------------------------------------------------

ගරු සභාපතිතුමනි මම ඉදිරිපත් කර සිටින්නේ කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුදුන්කොටුව ප්‍රධාන මාර්ගයේ තිබෙනවා ගරු සභාපතිතුමනි මුදුන්කොටුව පාලම. මුදුන්කොටුව පාලම අපේ පළාත් සභාවට අයිති මාර්ගයක්. මේකේ බස් රථයක් ධාවනය වෙනවා ගරු සභාපතිතුමනි. පාලම යට පිරිසක් විසින් මැණික් ගැරීම් කටයුතු කරනවා. ධාවනය කරනවා. මධ්‍යාහ්නයේ කරනවා. රාත්‍රීයේ කරනවා. මේ හැම වෙලාවකදීම ගරු සභාපතිතුමනි මේ පාලම කොයි වෙලාවක හරි සති දෙකක් යන කොට මුදුන්කොටුව පාලම සම්පූර්ණයෙන්ම බිමට වැටෙන තත්ත්වයක් තිබෙන්නේ. ප්‍රාදේශීය ලේකම්තුමියට කිව්වා. පොලිස් ස්ථානාධිපතිතුමාට කිව්වා. ඔබතුමා ඇහැලියගොඩ ආසනයේ සංවිධායකතුමා එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකතුමා ඔබතුමා. හැබැයි මට දැන ගන්න ලැබිලා තිබෙන්නේ ඇහැලියගොඩ ආසනයේ ජනාධිපතිතුමාට සම්බන්ධ ආසන සංවිධායකවරයාගේ නම අරගෙන එතුමාගේ නියෝග අනුව මේක කරනවා කියලා තමයි ගරු සභාපතිතුමනි අපිට ආරංචි වුණේ සහ කියන්නේ එහෙම තමයි. මේකට පොලිස් නිළධාරියෙකුත් සම්බන්ධයි. පොලිස් නිළධාරියා මෙතන ඇවිල්ලා වැඩ කරනවා. මේ පාලම යට වැඩ කරන තැන පොලිස් නිළධාරියෙකුත් වැඩ කරනවා. එතකොට ගරු සභාපතිතුමනි පොලිස් ස්ථානය කිරිඇල්ලට මම පෞද්ගලිකව ගිහිල්ලා කතා කරලා කිව්වා. ඒවගේම මමයි සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමයි දෙන්නම ගිහිල්ලාත් කිව්වා. බලන කොට ජනාධිපති වරප්‍රසාද අරගෙන තමයි කරන්නේ. අපි කිව්වහම මේ වැඩේ කරන්නේ නෑ. ගමේ මිනිස්සු ඇවිල්ලා අපිට කියනවා මන්ත්‍රීතුමා මේක බලා ගන්නේ නැද්ද කියලා. ඉතිං මම කියන්නේ මේක මෙහෙම වෙන්න බෑ. දවසකට දහ දාහකට විසි දාහකට වැඩි ප්‍රමාණයක් යන එන ප්‍රධාන පාරක්. අපේ බස් දුවන ප්‍රධාන පාරක්. මේ විදිහට මහ දවල් මේවගේ අසාධාරණ වැඩ කරනවා නම් මෙච්චර කාලයට මෙතන මැණික් ගරන්න දීලා මැණික් හම්බ වෙලා තියෙනවා. අපි ඒකට සුභ ප්‍රාර්ථනය කරනවා මැණික් හම්බ වෙලා තියෙනවා නම් කාට හරි. ඒකෙන් දියුණු වෙනවා නම්. ඒක කමක් නෑ. අපේ දේපළ අවභාවිතා වෙන විදිහට අපේ ගම්මුන්ට බලපෑම් කරලා ගම්මුන්ගේ අයිතිය නැති කරන්න හදනවා නම් අපි මේකට අපේ බලවත් විරෝධය අප්‍රසාදය එළ කරනවා ගරු සභාපතිතුමනි. සම්බන්ධීකරණ කමිටුවටත් මේ ගැන කියන්න ඉන්නේ.

ගරු සභාපතිතුමා මගේ තව යෝජනාවක් තිබෙනවා. මම අවසන් කරනවා ගරු සභාපතිතුමනි මේ ඊළග කාරණය විශේෂයෙන්ම මේ වෙන කොට දැඩි නියගය පවතින නිසා දැඩි නියගයකට අපි මුහුණ දීලා තියෙනවා සමස්ත සබරගමුවම . ශ්‍රී ලංකාවම. විශේෂයෙන්ම වතුර තියෙන කාලයකදී අපි පරිසරය පිළිබඳව කටයුතු කිරීම අපගේ බොහොම දුර්වල තත්ත්වයක් තිබෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි මේ ජලමූලාශ්‍ර ආරක්ෂා කර ගැනීම පිළිබඳව අපි මීට වඩා හොඳින් කටයුතු කිරීම මම කියන්නේ සුදුසු බව. ජල මූලාශ්‍ර විනාශ වෙනවා සෑහෙන කාලයකට මේ වතුර තියෙන කාලයකට. ගස් කපලා ඒවගේම තේ වගා කිරීම ජල මූලාශ්‍ර ආසන්නයටම ගෙනල්ලා මේ නිසා මම යෝජනා කරනවා පළාත් සභාවේ ජල මූලාශ්‍ර ආරක්ෂා කර ගැනීම සඳහා ඒ

ප්‍රදේශවල අලුතින් වන රෝපණ ආරම්භ කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න කියලා යෝජනාව මම මේ අවස්ථාවේදී අනාගත පරපුර වෙනුවෙන් යෝජනා කර සිටිනවා.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*
----------------------------------------------------

ගරු සභාපතිතුමනි මේ පොඩ්ඩක් මගේ නම සඳහන් කළ නිසා මේ සම්බන්ධව අපේ නමින්ද අනුරප්‍රිය ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව අපි දෙන්නාම ගිහිල්ලා බැලුවා ගරු සභාපතිතුමා. මේක විශාල ප්‍රශ්නයක්. මොකද ජනාධිපතිතුමාගේ නම විකුණලා ඇහැලියගොඩ මේ වගේ කැත වැඩ කරන පුද්ගලයෙක් ඉන්නවා. මම කෙලින්ම කියනවා. මේක ජනාධිපතිතුමාටත් මගේ හිතේ අපකීර්තියක්. දැන් ඔය කියාපු පාලම ගරු සභාපතිතුමනි බටහිර මුදුන්කොටුව පාලම ඒක හදා ගන්න බෑ. කෝටි දහයකටවත්. මොකද ගංවතුර ගලනවා. විවිධ ප්‍රශ්න තියෙනවා. ඒ පැත්තේ මිනිස්සුන්ට යන්න තියෙන එකම පාලම. මේක පොලීසියට කිව්වහම පොලීසියේ නිළධාරීන්ටත් තර්ජනය කරනවා ගරු සභාපතිතුමනි. නැත්නම් මේ පොලිස් ස්ථානාධිපතිතුමා හරිම හොඳයි කිරිඇල්ලේ ඉන්න. එයා කිව්ව පරක්කුවට අකටයුත්තක් වෙනවා නම් අවැඩක් වෙනවා නම් ඒ ගැන ක්ෂණිකව හොයලා බලලා කටයුතු කරන ස්ථානාධිපතිවරයෙක් කිරිඇල්ලේ ඉන්නේ. නමුත් ඒ නිළධාරී මහත්මයාටත් මේක ප්‍රශ්නයක් වෙලා තියෙනවා ගරු සභාපතිතුමනි මේ පුද්ගලයාගෙන්. මේ පුද්ගලයා එකක්,දෙකක්,තුනක් නෙමෙයි ගරු සභාපතිතුමනි ජනාධිපතිතුමා අපකීර්තියට පත් කරන්න වැඩ කටයුතු කරන පුද්ගලයෙක් කියන එක ඔබතුමාට මතක් කරනවා.

ඒවගේම අර ජල ප්‍රශ්ය ගැන ගත්තහම ගරු සභාපතිතුමනි අර නියඟය වෙලාවට තමයි අර වඳුරා තෙමෙන කොට ඊට හිරි කඩු දාගෙන දාඩිය දාගෙන වෙව්ලන කොට තෝ මිටියයි,මං මිටියයි,කොළ මිටියයි කෙළි මිටියයි කියලා කියනවා. උදේට ගහෙන් ගහට පැනලා යනවා. ඒවගේම තමයි මේ ජල මූලාශ්‍ර ඉල්ලන අය. පරිසරය ගැන කතා කරන අය මේවගේ තමයි. එහෙම නෙමෙයි අපි දීර්ඝ කාලීන වැඩ පිළිවෙලක් තියෙන්නට ඕනේ. දීර්ඝ කාලීන වැඩ පිළිවෙලක් තමයි ගරු සභාපතිතුමනි අවුරුදු 35 ක් ඉඩම් අක්කර අටයි කාලක් අපි වන වගාව දලා නවත්තලා තියෙනවා. ඇහැලියගොඩ ඕනම තැනකට ඇහැලියගොඩ භාර පන්දාහකට වතුර දෙන්නට පුළුවන් දිය උල්පතක් ඇති කරගෙන තියෙනවා මම. ඒ දීර්ඝ කාලීන වැඩ පිලිවෙලක්. මේක එහෙම නෙමෙයි පායන කාලයට ජල මූලාශ්‍ර හොයන්නට ඕනේ පැළ හිටවන්නට ඕනේ. කුඹුක් ගස් හිටවන්නට ඕනේ. මේක දීර්ඝ කාලීන වැඩ පිළිවෙලක් වෙන්ට ඕනේ. ජාතික වැඩ පිලිවෙලේ ප්‍රතිපත්තියක් වෙන්නට ඕනේ මේකේ. ගහ කොළ සිටුවීම, පරිසරය ආරක්ෂා කර ගැනීම. ජල උල්පත් රැක ගැනීම මේ ගැන අවධානය යොමු වෙන්නට ඕනේ ගරු සභාපතිතුමනි. මේ ගරු සභාවට යෝජනාවක් වශයෙන් හරි ගෙනල්ලා මේ මන්ත්‍රීවරු 44 දෙනාම කතා කරලා හරි මේකට වැඩ පිළිවෙලක් ඉතා ඉක්මනින් කෙටි කාලයකින් යොදන්න කියලා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමනි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ගරු කරුණාපාල මන්ත්‍රීතුමාගෙන් පස්සේ ආයේ වෙන කවුරුවත් ඉල්ලන්න එපා. මේක දැන් රත්නායක ගරු මන්ත්‍රීතුමා කතා කරනවා. සිරිපාල මන්ත්‍රීතුමා කතා කරනවා. ඊට පස්සේ නමින්ද මන්ත්‍රීතුමා කතා කරනවා. ආයේ සිරිපාල මන්ත්‍රීතුමා කතා කරනවා. කරුණාපාල මන්ත්‍රීතුමා කතා කරනවා. මට සභාව ඉවර කර ගන්න හම්බ වෙන්නේ නෑ මේක. එක්කෝ ඇහැලියගොඩට වෙනම සභාවක් දා ගනිමු. මින් පස්සේ මේක ගැන කතා කරන්න එපා කියන්නයි ගත්තේ. ආයේ ඔබතුමා කතා කළාට පස්සේ රත්නායක මන්ත්‍රීතුමා කිව්වොත් මටත් කතා කරන්න ඕනේ කියලා. ඉල්ලුවොත් ඒයාටත් දෙන්න ඕනේ. ඒකයි. මට මේක කරන්න දෙන්න. ඔබතුමා ඉවර කරන්න.

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල***
***கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால*** *Hon.Member G.M.Karunapala*
------------------------------------------

මම කියන්න හදන්නේ අපි ඇහැලියගොඩ පදිංචි අය වශයෙන් මේකත් එක යහපාලන වැඩක්. මුදුන්කොටුවේ පාලම කැඩීම. හෙට අනිද්දා වෙන කොට හෙලිදරව් වෙයි. සඳහන් වෙයි. ගම්මු සූදානමක් තියෙනවා මේකට විරුද්ධව නැගී සිටින්න පක්ෂ විපක්ෂ සියළුම ගරු පළාත් සභා මන්ත්‍රීතුමන්ලාට අරාධනයකුත් එනවා. මේ පාලම බේරා ගන්නට. මුදුන්කොටුව. ඒ අනුව තිරසාරවම රජය මේකට මැදිහත් නොවෙන තත්ත්වයක් ඇති වෙලා තියෙනවා මොන හේතුවද අපි දන්නේ නෑ. පොලීසිය මඟ හරින අතර ඇතැම් රජයේ නිළධාරීන් මේ පිළිබඳව කටයුතු කරන්නේ නෑ. මේ නිසාම මැණික් කාට ගියත් හෙට අනිද්දා වෙන කොට සභාපතිතුමාත් කියයි කරුණාපාල කියපු එක හරි කියලා එදාට. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ගැන නොකියා. පාලම නැති වෙන කොට තමයි ප්‍රශ්නයට මුහුණ දෙන්නට වෙන්නේ. ඒ නිසා අපි මේ ඉල්ලීමක් කරන්නේ අපි මේ රක්ෂණය කරලා තියෙනවානේ. හෙට අනිද්දා වෙන කොට අපි මේකට පනිනවා. ඉල්ලන් ගන්නට නෙමෙයි. පාලම බේරා ගන්නට . රක්ෂණ ගාස්තු වැඩි කරන්නට කියලා ඉල්ලීමක් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තූතියි ගරු කරුණාපාල මන්ත්‍රීතුමනි. සිරිපාල මන්ත්‍රීතුමාත් නමින්ද මන්ත්‍රීතුමාත් ,විජේනායක මන්ත්‍රීතුමා ඉල්ලන්නේ නැනේ. හරි මේක අපි පොඩ්ඩක් වැදගත් විදිහට අපි අවසාන කර ගන්න කටයුතු කරමු. ගරු සිරිපාල මන්ත්‍රීතුමනි. සියළු දෙනාම . ප්‍රශ්නය බැරෑරුම් බව තේරෙනවා. මමත් ඇහැලියගොඩ ප්‍රදේශය ගැන අවබෝධයක් තියෙන කෙනෙක් හැටියට. මන්ත්‍රීතුමා දන්නවා. හරි මේ වෙන ප්‍රශ්නයක්නේ මතු වුණේ. එතකොට මේ කාරණාව පිළිබඳව බරපතල ප්‍රශ්නයක් කියලා මටත් වාර්තා වෙලා තියෙනවා. මේ අනුව දිස්ත්‍රික්කය පළාත භාර ජේ◌්‍යෂ්ඨ පොලිස්පතිතුමාටත් ඒවගේම නියෝජ්‍ය පොලිස්පතිතුමාටත් ඒවගේම විෂයභාර අමාත්‍යවරයාත් මේ පිළිබඳව දැනුම්දීලා

මේ පිළිබඳව කඩිනම් විසඳුමක් හැටියට යෝජනා කිරීමට පළාත් සභාව හැටියට අපි කටයුතු කරන බවට දැනුම් දෙනවා. මටත් මේ පිළිබඳව වාර්තා වෙලා තියෙනවා. ඉතාම නරක ආකාරයට කටයුතු සිද්ධවීගෙන යනවා කියලා. ඒ පිළිබඳව කඩිනම් විසඳුම් ලබාගැනීම සඳහා යෝජනා කරන බව දැනුම් දෙමින් මීළඟට සමිත ආටිගල ගරු මන්ත්‍රීතුමාගේ අවස්ථාව.

*ගරු මන්ත්‍රී සමිත ආටිගල*

*கௌரவ உறுப்பினர் சமித ஆடிகல* *Hon.Member Samitha Atigala*

--------------------------------------------

ගරු සභාපතිතුමනි අද උදේ කුරුවිට ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ නඩුකාරදෙනියේ අපිට පනිවිඩයක් ලැබුණා දැන්වීමක් ලැබුණා ජල උල්පත් සිදී ගිහිල්ලා වතුර නැහැ. වතුර ලබා දෙන්න කටයුතු කරන්න කියන ඉල්ලීම කලා. ඒ නිසා අපි සඳහන් කරන්නට ඕනේ කුරුවිට ප්‍රාදේශීය සභාව හරහා ඒ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට දැනුවත් කරලා නඩුකාරදෙනිය ප්‍රදේශයට ජලය ලබා දෙන්න කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා. ඒවගේම මේවෙන කොට නියඟය පැවතිලා ආයේත් වැහැලා දැන් පායන්න පටන් අරන් දවස් දහයක් පමණ තමයි ගත වෙලා තියෙන්නේ. අපි විශ්වාස කරනවා තව සතියක් දෙකක් මේ විදිහටම පැවිල්ල තත්ත්වය තිබුණොත් එහෙම නඩුකාරදෙනිය ප්‍රදේශයට පමණක් නෙමෙයි තවත් නොයෙකුත් ප්‍රදේශ වලින් මේ ඉල්ලීම ලැබෙන්න තියෙනවා. ඒක නිසා පුළුවන් ආකාරයකට හරි මේ විදිහට ජලය ලබාදීලා අපි දන්නවා මේ ප්‍රශ්නයට මුහුණ දෙන්නට අපහසුයි. නමුත් මේ ප්‍රදේශයේ ජනතාව ජීවත් වෙන්නත් ඕනේ. ඒ අපහසුතාවයන් පිළිබඳව සොයලා බලලා අදාල ප්‍රාදේශීය සභාවල ලේකම්වරු හරහා නැත්නම් ලේකම් තුමියලා හරහා දැනුවත් කරලා ජලය ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා ඒවගේම ගරු සභාපතිතුමනි කියන්නට ඕනේ මේ වෙලාවේදී මේ සම්බන්ධයෙන් යෝජනාවක් මේ සභාවට ඉදිරිපත් වුණත් ඒ පිළිබඳව අදහස් දක්වන්න අවස්ථාවක් අපිට අහිමි වුණා. අපි සඳහන් කරන්න ඕනේ මේ සම්බන්ධයෙන් කෙටි කාලීනව ගන්න ඕනේ පියවරයන් පිළිබඳව ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයෙන් දැනුවත් කිරීමක් අපි දැක්කා පහුගිය පුවත්පත්වල එළ වෙලා තිබුණා. නමුත් දිගු කාලීනවත් අපි මේකට මුහුණ දෙන්නට ඕනේ. නමින්ද අනුරප්‍රිය ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වගේම සිරිපාල කිරිඇල්ල ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වගේම ජල මූලාශ්‍ර රැක ගැනීමේ අවශ්‍යතාවය තියෙනවා. මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරලා ජල මූලාශ්‍ර අවට එළි කරන එක නවත්තන්න කලින්ටත් වැඩිය වැඩි බර තැබීමක් කරලා කටයුතු කිරීමේ අවශ්‍යතාවය තියෙනවා. ඒවගේම අපි සඳහන් කරන්නට ඕනේ මේ ජල ප්‍රශ්නයට මුහුණ දෙන්නට සූදානම් වෙන කොට අපි දන්නවා අදටත් ජල මූලාශ්‍ර තියෙනවා ඒවෙන් ප්‍රයෝජනයක් ගන්නේ නැහැ. අපිට බාධාව වෙලා තියෙන්නේ අවශ්‍ය ප්‍රතිපාදන මදිවීම. ඇත්තටම මේ සම්බන්ධයෙන් විශේෂයෙන්ම අපි වැඩ කටයුතු කරන්න ඕනේ වැඩිපුර මුදල් වෙන් කරලා වැඩි ප්‍රතිපාදන වෙන් කරලා ජල මූලාශ්‍ර වල ජලය ප්‍රයෝජනයට ගන්නේ නැති තැන් ගොඩාක් තියෙනවා. අන්න ඒවා පිළිබඳව අපි දැනුවත් වෙලා ඉන්නේ. ඒ පිළිබඳව උදව් උපකාර කරන්නට පළාත් සභාවට වැඩියෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කරලා කටයුතු කිරීමේ අවශ්‍යතාවය අපිට හොඳින් පැහැදිලි වෙලා පෙනී යනවා . ඒ නිසා වගකිව යුතු පළාත් සභාවක් හැටියට ජනතාවගේ ප්‍රශ්න පිළිබඳව සොයා බලන පළාත් සභාවක්

හැටියට ජනතාවගේ දැවෙන ප්‍රශ්නනයක් හැටියට මේ ජල ප්‍රශ්නයට මුහුණ දෙන්න අදටත් භාවිතා නොවෙන ජල මූලාශ්‍ර කඩිනමින් භාවිතා කරන තත්ත්වයට පත් කරන්න වැඩිපුර ප්‍රතිපාදන ලබා දෙන්න සුදුසුයි කියන යෝජනාව කරමින් ඔබතුමා අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ස්තූතිවන්ත වෙනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
----------------------------------------------------------

ස්තූතියි ගරු සමිත ආටිගල මන්ත්‍රීතුමනි. ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉතාම අත්‍යාවශ්‍ය වූ කඩිනම් යෝජනාව පිළිබඳව අදාල බලධාරීන් දැනුවත් කරමින් කඩිනම් පියවර ගැනීම සඳහා ක්‍රියාත්මක කර ඔබතුමා දැනුවත් කරන බව ප්‍රකාශ කරනවා. මීළඟට අකිල සාලිය එල්ලාවල ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා.*
*கௌரவ உறுப்பினர் அகில எல்லாவல*
*Hon. Member Akila Ellawala*
----------------------------------------------------------

ගරු සභාපතිතුමනි යෝජනාවක් නෙමෙයි ඇත්තටම ගරු සිරිපාල කිරිඇල්ල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව අද ඉදිරිපත් කරන්නේ නෑ කිව්වා. ලබන සභා වාරයට දානවා කිව්වා. මේ යෝජනාව ඉතාම වැදගත් හා අත්‍යාවශ්‍ය කාරණයක් සබරගමු විශ්ව විද්‍යාලයට. මට අවස්ථාවක් දෙන්නේ නම් මට තියෙන පෞද්ගලික කරුණු ටික මම ඉදිරිපත් කරන්නම්. මම එතුමාගෙන් අවසරයක් ඉල්ලනවා . මොකද ගරු මන්ත්‍රීතුමා මේක කල් දාන්න බෑ මේ ළමයි සිය දෙනා මේ අවුරුද්දේ ඇතුලත් කර ගන්න කාලය දැන් සීඝ්‍රන් ගෙවී යනවා. ඒක නිසා අපිට අවස්ථාව දෙනවා නම් මේ පිළිබඳව කරුණු ටික පැහැදිලි කරලා දෙන්න මම කියන්නේ මෙතුමාට පක්ෂපාතීව නෙමෙයි කතාව තියෙන්නේ. මගේ කරුණු ටික ඉදිරිපත් කරන්න අවස්ථාව දෙනවා නම් මම ලෑස්තියි ඉදිරිපත් කරන්න.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*
----------------------------------------------------------

පොඩ්ඩක් ඉන්න ගරු මන්ත්‍රීතුමා. ඒ යෝජනාවට කතා කරන මන්ත්‍රීවරු හතර දෙනෙක් හදිස්සියේ අද නිවාඩු ගිහිල්ලා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
----------------------------------------------------------

සිරිපාල මන්ත්‍රීතුමා ඔබතුමා කියන්නේ ඔබතුමාගේ යෝජනාව ඊළග එකට ඉල්ලුවානේ. එතුමා කියන්නේ වචන කීපයක් ප්‍රකාශ කරන්න. ඔබතුමා කියන්නේ ඒ ටිකත් එදාටම ඉදිරිපත් කරන්න කියලානේ. එතුමා කියන්නේ එතුමා එකහයි කියලා. ප්‍රකාශ කළොත් එතුමා අපහසුතාවයට පත් වෙනවා කියලානේ. ඊළග යෝජනා දවසේ ගන්න කියලා කියන්නේ.

*ගරු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා.*
*கௌரவ உறுப்பினர் அகில எல்லாவல*
*Hon. Member Akila Ellawala*
---------------------------------------------------------

මේක වැදගත් කාරණයක්. මේක අපිට කල් දම දමා ඉන්න බෑ. දැන් මේක ආණ්ඩුකාරතුමා එක්කත් සාකච්ඡාවක් කළා. දැන් ඒකෙදී ප්‍රතඵලයක් නෑ. දැන් සභාවට දාලා සභාව තියලා නැවත දවස් 14 කට පස්සෙයි නැවත සභාව තියෙන්නේ. ඒ නිසා ඉක්මනට සාකච්ඡා කරලා තීන්දුවක් ගන්න වෙයි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

දැන් ඒක කලින් කළ යුතුව තිබුණේ.

*ගරු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා.*
*கௌரவ உறுப்பினர் அகில எல்லாவல*
*Hon. Member Akila Ellawala*
---------------------------------------------------------

කල් දාන්න කල් දාන්න අතන අක්‍රමිකතා ටික සියල්ලක්ම සිද්ධ වෙනවා. මට කතා කරන්න බෑනේ. සභාවේ යෝජනාව ගෙනල්ලා නැනේ.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

යෝජනාව කල් තියලනේ තියෙන්නේ. එතුමා ඉල්ලීම කරන්නේ එතුමා යෝජනාව කල් දාලා තියෙන නිසා අද ඒ පිළිබඳව ප්‍රකාශ කරන්න ඒ වෙලාවේදී ගන්න කියලා තමයි එතුමා ඉදිරිපත් කරන්නේ. ඔබතුමා තීන්දු කරන්න ඔබතුමා ඒ සම්බන්ධයෙන් මොකක්ද කරන්නේ කියලා. එතුමා කියනවා ඒක එදාට ගන්න කියලා. එතුමාට ආපු යෝජනාව එතුමා කල් තිබ්බා .

*ගරු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා.*
*கௌரவ உறுப்பினர் அகில எல்லாவல*
*Hon. Member Akila Ellawala*
---------------------------------------------------------

ගරු සභාපතිතුමා මට මගේ අදහස පමණක් ඉදිරිපත් කරන්න අවස්ථාවක් දෙන්න. මට අවස්ථාව දෙන්න. මොකද මේකේ ඡන්දයක් නැනේ.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

මේක කල් තියලා අවසානයි. අවසාන යෝජනාව තමුන්නාන්සේගේ තියෙන්නේ.

*ගරු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා.*
*கௌரவ உறுப்பினர் அகில எல்லாவல*
*Hon. Member Akila Ellawala*
---------------------------------------------------------

ගරු මන්ත්‍රීතුමා සමහරක් වෙලාවට මට මීළඟ සභාවට එන්න වෙන්නේත් නෑ. රටින් බැහැරව ඉන්න අවස්ථාවක් වෙයි. ඒ නිසා අද මගේ කරුණු ටික පැහැදිලි

කරලා යන්නම්. ඔබතුමා වාද විවාද කළාට මෙතන ඡන්දයක් ගන්නේ නැනේ.

ඒ නිසා ගරු සභාපතිතුමනි මම මේ අවස්ථාවක් කර ගන්නවා ගරු සභාපතිතුමනි ඔබතුමාගේ අවසරය මත. සබරගමු විශ්ව විද්‍යාලයේ ආරම්භය 1991 අතිගරු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ සංකල්පයක් මත තමයි මේ විශ්ව විද්‍යාලය අනුබද්ධිත විශ්ව විද්‍යාලයක් බවට ආරම්භ කලේ 1991. ඊට පස්සේ 1996 තමයි ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය...

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
---

දැන් මෙතුමා කියනවා මෙතුමාගේ යෝජනාව වෙලාවේදී කතා කරනවා නම් එතුමාගේ වෙලාවේදී කතා කරන්නලු.

*ගරු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා.*
*கௌரவ உறுப்பினர் அகில எல்லாவல*
*Hon. Member Akila Ellawala*
---

නෑ අද න්‍යාය පත්‍රයේ තියෙනවානේ ගරු සභාපතිතුමා. අද න්‍යාය පත්‍රයේ දාලා තියෙනවානේ යෝජනාව.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
---

නෑ දාලා තියෙන යෝජනාව එතුමා කල් ඉල්ලුවානේ ඊළඟ සභාවට. එතුමන්ලාගේ මන්ත්‍රීතුමන්ලා නෑ කියලා. ඔබතුමා තීන්දු කරන්න ඔබතුමාටත් අයිතියක් තියෙනවා. ඔබතුමාට ඒ යෝජනාව ඉදිරිපත් කරන්න. එතුමාටත් අයිතියක් තියෙනවා එතුමා ඉල්ලීමක් කරනවා මම ඒ යෝජනාව ඉදිරිපත් කළා කියන එක. මට එල්ල කරන්න එපා ඔබතුමන්ලා තීන්දු කරන්න මේක තත්ත්වය මොකක්ද කියන එක.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*
---

හදිසි යෝජනාවක් මේක. නමුත් අද දින මේකට කතා කරන්න හිටපු මන්ත්‍රීවරු හතර දෙනෙක්ම හදිස්සියේ රෝගාතුර වුණ නිසා ඒ අයම කිව්වා මේක ඊළඟ දිනයට ගනිමු කියලා. මෙය කාලෝචිතයි ඉතා ඉක්මනින් වෙන්න ඕනේ. නමුත් 28 කියන එක ඒ තරම් කාලයක් නෙමෙයි ගරු මන්ත්‍රීතුමනි. දවස් 20 යි තිබෙන්නේ. ඊට මෙහා මේ ප්‍රශ්නය ගත්තයි කියලා අපිට මොකුත් වෙන්නේ නෑ.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

අකිල මන්ත්‍රීතුමා ඔබතුමා මොකක්ද යෝජනා කරන්නේ. කියන්න හදන්නේ මොකක්ද ඔබතුමා.

*ගරු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා.*
*கௌரவ உறுப்பினர் அகில எல்லாவல*
*Hon. Member Akila Ellawala*
------------------------------------------------------------

මගේ පෞද්ගලික අදහස මගේ යෝජනාව ප්‍රකාශ කරන්න තමයි මම අවස්ථාව ඉල්ලන්නේ. මොකද සමහරක් වෙලාවට 28 වෙනිදා මම නැති වෙන්න පුළුවන්. ලංකාවේ. ඒක නිසා ගරු සභාපතිතුමනි , ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න ඕනේ ඔබතුමාට

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ඔබතුමා අවශ්‍ය දේ කියන්නකෝ මොකක්ද කියලා.

*ගරු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා.*
*கௌரவ உறுப்பினர் அகில எல்லாவல*
*Hon. Member Akila Ellawala*
------------------------------------------------------------

එම නිසා මෙම යෝජනාව ගරු සභාපතිතුමා ළමයි 100 ක් 75 ක් සම්බන්ධයෙන් තමයි මේ තාක්ෂණ පීඨයට අලුත් විෂයක් හැටියට මේ සබරගමු විශ්ව විද්‍යාලයේ ආරම්භ කරන්න හදන්නේ මේ තාක්ෂණ පීඨය. රත්නපුරයට ගේන්න ඕනේ කියන එකනේ මෙතුමාගේ යෝජනාව. මම කියන්නේ බලංගොඩ සබරගමු විශ්ව විද්‍යාලයේ දැනට දරුවෝ ඉන්නවා ශිෂ්‍ය ශිෂ්‍යාවන් භාරදාහකට අධික ප්‍රමාණයක් ඉන්නවා. ඒ සියළුම දෙනාට මහින්ද රාජපක්ෂ රජය කාලයේ දී නේවාසිකාගාර හදලා දුන්නා. නේවාසිකාගාර සියළුම දෙනාට තියෙනවා. ක්‍රීඩාපිටි,ශ්‍රවනාගාර , සබරගමුවේ තියෙන හොඳම ක්‍රීඩාපිටිය තියෙන්නේ අද සබරගමු විශ්ව විද්‍යාලයේ. ඉතිං මේ සියළුම පහසුකම් තියෙද්දී මෙම තාක්ෂණ පීඨය රත්නපුරට ගෙන ඒම පිළිබඳව අපි පෞද්ගලිකව විරුද්ධයි. මොකද හේතුව තමයි සබරගමු විශ්ව විද්‍යාල භූමියේ ඕන තරම් ඉඩ ප්‍රස්තාර තියෙනවා අලුත් ගොඩනැගිල්ලක් හදන්න. මේ ළමයි සීයක් තමයි අලුතින් ගන්න හදන්නේ. මේ රත්නපුරට ගේන්න හදන්නේ ලක්ෂ දහයක කුළියට බිල්ඩිමක් අරන් තමයි මේ රත්නපුරට ගේන්න හදන්නේ. රත්නපුරේ තාක්ෂණ ටෙක්නිකල් කොලේජ් එකක් තියෙනවා කියලා තමයි කියන්න හදන්නේ. නමුත් මේක අලුත් විෂයක්. අලුත් පීඨයක් ඒක ආචාර්ය අම්පිටියාවත්ත ආචාර්ය තුමා තමයි මේ විෂය සම්බන්ධයෙන් ප්‍රධාන ආචාර්යවරයා හැටියට මේකේ කටයුතු කරන්නේ. නමුත් මෙතුමා කැමතියි සබරගමු විශ්ව විද්‍යාල භූමිය තුළම අලුත් විශ්ව විද්‍යාලයක් මේ පීටය ඇති කරන්න. නමුත් මේ ගේන්න හදන්නේ සමහරුන්ගේ ආචාර්යවරුන්ගේ මහාචාර්යවරුන්ගේ පෞද්ගලික අවශ්‍යතා මත. මොකද කොළඹ ඉන්න ආචාර්යවරුන්ගේ මහාචාර්යවරුන්ට රත්නපුරට ඇවිල්ලා යන එක ලාභයි බෙලිහුල්ඔයට එන එකට වැඩිය. ඉතිං මෙන්න මේවගේ පෞද්ගලික කාරණා මත මේ දරුවෝ සිය ගෙනාගේ සම්පූර්ණ ක්‍රියා පරිපාටිය අපහසුතාවයට පත් කරන්න තමයි අපේ උපකුලපතිතුමා ඇතුළු ඒ කණ්ඩායම කරන්න හදන්නේ.

ඉතිං මේකට ශිෂ්‍යයෝත් විරුද්ධයි ප්‍රදේශයේ ජනතාවත් විරුද්ධයි. කථිකාචාර්යවරුනුත් විරුද්ධයි. ඉතිං මේ ගැන අපේ ආණ්ඩුකාරතුමාත් සාකච්ඡාවක් කළා නමුත් ආණ්ඩුකාරතුමාටත් වැරදි මතයක් තමයි දීලා තිබුණේ රත්නපුරට ගේන එක හොඳයි කියලා මම කියන්නේ මම යෝජනා කරන්නේ මේ ප්‍රායෝගික පැත්ත මේ දරුවන්ට ලබා දෙන්න තියෙන පැත්ත ඒක මේ විෂයපතය හදන කොට ඒ පිළිබඳව කල්පනා කරලා බලලා ඒ දරුවෝ ටික රත්නපුරට ගෙනල්ලා ටෙක්නිකල් කොලේජ් එකේ ඒ ප්‍රායෝගික අත්දැකීම ගන්න අවස්ථාව හදන්න ක්‍රමවේදයක් හදන්න පුළුවන්. ඒ ඇරෙන්න රත්නපුරේ ඉඩමක් තියෙනවා කියලා විශ්ව විද්‍යාලයට අයිති ඉඩමක් රත්නපුරේ තියෙනවා රත්නපුරේ අලුතින් ඇවිල්ලා බිල්ඩින් එකක් හදන්න අවශ්‍යතාවයක් නෑ. එහෙම නම් සබරගමු විශ්ව විද්‍යාලයේම හදන්න පුළුවන්. සබරමු විශ්ව විද්‍යාලයේ ඕන තරම් භූමි ප්‍රමාණය තියෙනවා. ඒ නිසා මගේ කරුණු ටික ඕකයි. නමුත් ඔබතුමා යෝජනාව ගේන දවසේ මම ලංකාවේ හිටියොත් අනිවාර්යයෙන්ම මම වාදයට එක් වෙනවා. ඒ පිළිබඳව ඔබතුමාත් කරුණු කාරණා හොයලා බලලා මේ පිළිබඳව හොයලා බලලා කටයුතු කරන්න. මේ පිළිබඳව අපි ඉක්මනින් ක්‍රියාත්මක වුනේ නැත්නම් මේ දරුවෝ සියළු දෙනාට මේ අවුරුද්දේ විශ්ව විද්‍යාලයට ඇතුලත් වෙන්න ක්‍රමවේදයක් නෑ.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

-------------------------------------------------------------

ස්තූතියි ගරු අකිල සාලිය එල්ලාවල මන්ත්‍රීතුමනි. මේ පිළිබඳව අපි දිගට කතා කළ යුතුයි කියලා අපි විශ්වාස කරන්නේ නෑ. ගරු සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා විසින් මේ යෝජනාව අද මේ ගරු සභාවට ඉදිරිපත් කරලා තිබුණා. හැබැයි එතුමා විසින් එතුමාගේ කණ්ඩායමේ තියන යම්කිසි අපහසුතාවයක් හේතු කරගෙන මීළග සභාවට ඉදිරිපත් කරන ලෙස එතුමා ඒ යෝජනාව කල් දාන ලෙස ඉල්ලීම කළා. ඒවගේම ගරු අකිල සාලිය එල්ලාවල මැතිතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේ මේ පිළිබඳව සාකච්ඡා කරන්න අවස්ථාව ලබාදුන්නේ. එතුමාට ඉතා කෙටියෙන් දුන්නේ ,එතුමා විසින් තීන්දු කරලා මේ කාරණාව පැහැදිලි කළේ ඔබතුමා විසින් තීන්දු කළේ ඒ යෝජනාව රත්නපුරට ගේන්න කියලා. එතුමා කියනවා වඩාත් සුදුසුයි ඒක බලංගොඩ පැවතීම වඩාත් සුදුසුයි කියන එක. ඒ පිළිබඳව පැහැදිලි කළේ. ඒ නිසා ඒ පිළිබඳව ඊළග සාකච්ඡාවේදී සාකච්ඡා කිරීමට ඉඩකඩ තබමින් දැන් වේලාව 11.43 යි. අද දිනට මෙම ගරු සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා. මම ගරු සභාව 2017 ක්වූ පෙබරවාරි මස 28 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබනවා.

කංචන ජයරත්න,
සභාපති,
සබරගමුව පළාත් සභාව.

පී.එස්.ආර්.එම්.විජයරාජ,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

2017.02.13වෙනිදින,
සභා ලේකම් කාර්යාලයේ දීය.